## හැඳින්වීම

ආචාර්ය මාර්ටින් වික්‍රමසිංහ මහතුන් විසින් විවිධ විෂයයන් විමර්ශනය කරමින් සිංහල, ඉංග්‍රීසි දෙබසින් විවේචනාත්මක ව ලියන ලද ග්‍රන්ථ සහ ලිපි ලේඛන එකතුවක් සකස් කළ යුතු යයි මාර්ටින් වික්‍රමසිංහ භාරකාර මණ්ඩලය තීරණය කරන ලදී.

ආචාර්ය වික්‍රමසිංහ මහතුන්ගේ විශදඥානය විවිධ විෂයයන් කෙරෙහි යොමු වී පැවැතිණි. ඒ නිසාම එතුමන් ලියූ මේ ග්‍රන්ථ සහ ලිපි ලේඛන රාශිය පර්යේෂණ කාර්යයන්හි නිරත භාෂා-සාහිත්‍ය හිතකාමී බුද්ධිමත් තරුණ පරපුරට තම දැනීම සහ බුද්ධිය දියුණු කර ගැනීමට විශේෂයෙන් ඉවහල් වනු ඇත.

මේ ලිපි ලේඛන එකතුව ශාස්ත්‍රීය පර්යේෂණයක ස්වරූපයෙන් සකස් කර දුන් ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ධනපාල ගුණසේකර මහතුන්ට මාර්ටින් වික්‍රමසිංහ භාරකාර මණ්ඩලයේ සහ භාෂා-සාහිත්‍ය හිතකාමීන්ගේ ද ගෞරවය සහ ස්තුතිය පිරිනැමෙන්නේ ය.

මේ බවට,
මොරටුවේ ශාසනරතන අනුනායක ස්ථවිර
මාර්ටින් වික්‍රමසිංහ භාරකාර මණ්ඩලයේ සභාපති.
රන්කොත් විහාරය,
පානදුර.

# පටුන

| | |
|---|---|
| | පිටු |
| හැඳින්වීම | 1 |
| පෙරවදන | සස |
| මාර්ටින් වික්‍රමසිංහ | 77 |
| Preface | 77 |
| Martin Wickramasinghe | 88 |
| ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය | 99 |
| සිංහල කෘතීන් | 99 |
| ලේඛන නාම හා ප්‍රමුඛ පද සූචිය | 88 |
| Writing in English | 88 |
| Title and Keyword Index | 99 |
| Subject Index | -- |
| Writings in other languages | 00 |

# පෙරවදන

ලාංකික සමාජය කෙරෙහි බලපෑමක් ඇති කළ නූතන ලේඛකයන් අතුරින් මාර්ටින් වික්‍රමසිංහ ශූරීන්ට හිමිවන්නේ වැදගත් ස්ථානයකි. පුවත්පත් කලාවේදියෙකු, ලේඛකයෙකු හා විචාරයෙකු වශයෙන් පමණක් නොව, චින්තකයෙකු වශයෙන් ද ලාංකික පාඨකයන් කෙරෙහි ඔහු කළ මහත් බලපෑම පිළිබඳ ප්‍රමාණවත් අධ්‍යයනයක් මේ දක්වා කෙරී නැත.

වර්ෂ 60 ක පමණ දීර්ඝ කාල පරිච්ඡේදයක් තුළ ඔහු අතින් බිහිවූ ලේඛන සංඛ්‍යාව දෙදහසකට ආසන්නය. විවිධ විෂයයන් යටතේ රචිත මෙම ලේඛන පිළිබඳ මනා දැනුමකින් තොරව මාර්ටින් වික්‍රමසිංහයන්ගෙන් ඉටුවූ සේවාව පිළිබඳ ප්‍රමාණවත් අධ්‍යයනයක් කළ නොහැකිය.

මෙම ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය ඔහුගේ ලේඛක ජීවිතය සහ එයින් ඉටුවූ ද, ඉදිරියට ඉටුවන්නා වූ ද සේවාවන් පිළිබඳ මනා හැදෑරීම්වලට තුඩු දෙන බව නිසැකය. තත්කාලීන පාඨක අවශ්‍යතාවයන් හා රුචිකත්වයන්හි ප්‍රවණතාවයන් පිළිබඳ දළ අවබෝධයක් ලබාගැනීමට ද මෙම කෘතිය පිටිවහලක් වනු ඇතැයි සම්පාදක අදහස් කරයි.

ලේඛකයකු අලලා සකස් කරනු ලබන ග්‍රන්ථ නාමාවලියකින් බලාපොරොත්තු වන කාර්යයන් දෙකක් වෙයි. එම ලේඛකයා විසින් රචිත කෘතීන් පිළිබඳව තොරතුරු එක්රැස් කිරීම ඉන් පළමුවැන්නයි. දෙවැන්න වන්නේ එම ලේඛකයා හෝ ඔහුගේ ලේඛන පිළිබඳව අන්‍යයන් විසින් රචිත කෘතීන් පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමයි. මෙම ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය මගින් ඉටුකර ඇත්තේ මෙයින් පළමුවන කාර්යය පමණි. මාර්ටින් වික්‍රමසිංහයන් පිළිබඳවත් ඔහුගේ කෘතීන් පිළිබඳවත් ලියැවී ඇති ලේඛනවල තොරතුරු ඇතුළත් ග්‍රන්ථ හා ලේඛන නාමාවලියක් සම්පාදනය කිරීමද ආරම්භ කොට ඇත.

මාර්ටින් වික්‍රමසිංහ විසින් රචිත සියලුම ග්‍රන්ථ හා ලේඛන පිළිබඳව තොරතුරු එක්රැස් කිරීම සම්පාදකගේ මූලික අරමුණ වූ නමුත් එම කාර්යය සර්ව සම්පූර්ණ ආකාරයෙන් ඉටු කිරීමට බාධකවූ කරුණු කිහිපයක් විය. සාහිත්‍ය ගවේෂණයේ හෙවත් ලේඛන පරීක්ෂාකිරීමේදී සීමාවන් නිර්ණය කිරීමේ දුෂ්කරතාවය ද, ලේඛන පිළිබඳ තොරතුරු සොයා ගැනීමේ මූලාශ්‍ර නොවීම හා ලේඛන සොයා ගැනීමේ දුෂ්කරතාවය ද මෙයින් ප්‍රමුඛ විය.

පුවත්පත් කලාවේදියෙකු ලෙස සේවය කළ දීර්ඝ කාලය තුළ මාර්ටින් වික්‍රමසිංහයන්ගේ ලේඛන කාර්යය විෂය ක්ෂේත්‍ර රැසියක් තුළ පැතිරගිය එකක් විය. ඔහුගේ වැඩි අවධානය යොමුවී තිබුණු භාෂාව සාහිත්‍යය, සංස්කෘතිය, ආගම, මානව විද්‍යාව වැනි විෂයයන්ට අතිරේක වශයෙන් තවත් විෂයයන් කිහිපයක්ම ඔහුගේ විමසුම් ඇසට ලක්විය. නවකථා, කෙටිකථා වැනි නිර්මාණාත්මක කෘතීන් රැසක් බිහිකළ ඔහු ළමා සාහිත්‍ය කෘතීන් කිහිපයක් ද රචනා කළේය. ග්‍රාමීය විද්‍යාව, සාහිත්‍යය, ප්‍රජාචාරය වැනි විෂයයන් සඳහා ප්‍රාථමික පාසැල්වල භාවිතයට අවශ්‍ය පාඨ ග්‍රන්ථ කිහිපයක්ද ඔහු සම්පාදනය කළේය. ඔහුගේ කෘතීන් කිහිපයක්ම අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් විවිධ පරීක්ෂණ සඳහා නිර්දිෂ්ඨ ග්‍රන්ථ ලෙස කලින් කල යොදා ගෙන තිබුණි. විද්‍යා විෂයයන් සිංහලයට හඳුන්වාදීම ඔහු අතින් ඉටුවූ තවත් කාර්යයකි. සත්ව විද්‍යාව, මානව විද්‍යාව වැනි විෂයයන් මෙහිදී ඔහුගේ විශේෂ අවධානයට ලක්වී ඇත. තවද, පුවත්පත් කලාවේදියෙකු වශයෙන් කාලීන වැදගත් කමකින් යුත් මාතෘකා රාශියක් යටතේ ලිපි විශාල සංඛ්‍යාවක් ද ඔහු විසින් රචනා කොට ඇත. මේ සියල්ලේම ප්‍රතිඵලය වූයේ ඔහුගේ විෂය පථය ඉතා පුළුල් එකක් වීමය. මෙම ග්‍රන්ථයට ඇතුළත් කොට ඇති විෂය සූචිය පරීක්ෂා කළහොත් මේ බව පැහැදිලි වනු ඇත. මේ තත්වය මත මෙම ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය සඳහා ලේඛන පරීක්ෂා කිරීමේදී විෂය වශයෙන් සීමාවක් නිර්ණය කර ගැනීම කිසිසේත්ම කළ නොහැක්කක් විය.

සිංහල හා ඉංග්‍රීසි යන මාධ්‍ය දෙකින්ම ලේඛන කාර්යයේද නිරත වූ මාර්ටින් වික්‍රමසිංහයන් විසින් ලංකාවේ පළවූ සෑම ප්‍රධාන පුවත්පතකටම හා සඟරාවකටම පාහේ ලිපි සපයා ඇත. පාසැල් වලින් නිකුත් කරන ශිෂ්‍ය සඟරාවලට මෙන්ම ලංකාවේ ප්‍රමුඛ ශාස්ත්‍රීය සඟරාවලට ද ඔහුගේ ලිපි

ඇතුළත් විය. වර්ෂ 60 ක පමණ දීර්ඝ කාල පරිච්ඡේදයක් පුරා සිංහලෙන් හා ඉංග්‍රිසියෙන් පළවූ පුවත්පත් හා වාරසඟරා සියල්ලම පරීක්ෂා කිරීම කිසිසේත්ම ප්‍රායෝගික කටයුත්තක් නොවීය. මේ නිසා ඔහුගේ ලේඛන පිළිබඳව තොරතුරු සපයා ගැනීම සඳහා පරීක්ෂා කළයුතු ප්‍රකාශන සංඛ්‍යාව නිර්ණය කර ගැනීම දුෂ්කර කාර්‍යයක් විය.

දේශීය ප්‍රකාශන අලලා ග්‍රන්ථ නාමාවලි සම්පාදනයේ දී මුහුණ පෑමට සිදුවන ප්‍රමුඛතම බාධකය් වන, ලේඛණ පිළිබඳව තොරතුරු ලබා ගතහැකි මූලාශ්‍රවල විරල බව, මෙම ග්‍රන්ථ නාමාවලිය සම්පාදනය කෙරෙහි බලපෑ දෙවන සාධකය විය.

තමන් විසින් වරින් වර වාර සඟරාවලට හා පුවත්පත්වලට සපයන ලද ලිපි පිළිබඳ වාර්තාවක් මාර්ටින් වික්‍රමසිංහයන් සතු නොවීය. එසේම ඔහුගේ ලිපි පිළිබඳ පූර්ණ තොරතුරු ලබාගත හැකි වෙනත් මූලාශ්‍රයක්ද නොවීය. 1962 පළවූ නව ලෝකය මාර්ටින් වික්‍රමසිංහ උපහාර කලාපයටද (29 කාණ්ඩය, 4 කලාපය) 1978 දී දෙහිවල තිසර ප්‍රකාශකයින් විසින් පළකරන ලද ''කොග්ගල මහා ප්‍රාඥයා'' ග්‍රන්ථයට ද මාර්ටින් වික්‍රමසිංහයන්ගේ ග්‍රන්ථ හා ලේඛන නාමාවලි ඇතුලත් විය. එහෙත් එම නාමාවලි දෙකටම ඇතුළත්ව තිබුණේ ඔහු විසින් රචිත ලිපි කිහිපයක් පිළිබඳ තොරතුරු පමණකි.

තවද, දේශීය පුවත්පත් හා වාර සඟරාවල පළවන ලිපි සඳහා අඛණ්ඩ සූචිකරණ සේවාවක් නොතිබීම ද මෙම සාහිත්‍ය ගවේෂණයේදී මුහුණ පෑමට සිදුවූ තවත් බාධකයක් විය. තමන් විසින් පළකරනු ලබන පුවත්පත්වල ඇතුළත් ලිපි පිළිබඳව හෝ සූචියක් පවත්වා ගෙන යාමට ලංකාවේ ප්‍රධාන පුවත්පත් ප්‍රකාශකයින් පවා අපොහොසත් වී ඇති බව පෙනේ. කෙසේ වුවද තෝරාගත් වාර සඟරා ලිපි සූචියක් කොළඹ කෞතුකාගාර පුස්තකාලය විසින් 1969 සිට පවත්වාගෙන යනු ලැබේ.

ලේඛන සොයාගැනීමේ දුෂ්කරතාවය සම්පාදකට මුහුණපෑමට සිදුවූ තුන්වන ප්‍රශ්නය විය. මාර්ටින් වික්‍රමසිංහයන් විසින් රචිත ඇතැම් ලේඛන කිසිසේත්ම සොයාගත නොහැකි පරිද්දෙන් අභාවයට ගොස් තිබුණි. එම ලේඛන පිළිබඳ තොරතුරු ආරංචි මාත්‍රයට පමණක් සීමාවිය. ලංකාවේ ග්‍රන්ථ තැන්පතු නීතිවල දුර්වලතාවය නිසා මෙරට පළවූ ප්‍රකාශනවලින් සැළකිය යුතු සංඛ්‍යාවක් ලියාපදිංචි කිරීමට හා තැන්පත් කිරීමට රාජ්‍ය ලේඛනාගාර දෙපාර්තමේන්තුව අපොහොසත් වී ඇත. අතීතයේ ප්‍රමාණවත් ගබඩා පහසුකම් නොතිබීම වැනි විවිධ දුෂ්කරතාවයන් හේතුකොට ගෙන එසේ ලබාගත් ලේඛනවලින් ද ඇතැම් ඒවා විනාශයට පත්වන්නට ඇතැයි සිතමි. මෙම හේතූන් නිසා මාර්ටින් වික්‍රමසිංහ ශූරීන්ගේ ග්‍රන්ථවල සියලුම මුද්‍රණ සොයා ගැනීම පවා අපහසු විය. එපමණක් නොව ප්‍රථම මුද්‍රණය සොයාගත හැකි වූයේද ග්‍රන්ථ කිහිපයක පමණි. සොයාගත නොහැකිවූ මුද්‍රණයන් සඳහා සංලේඛ පිළියෙල කරන ලද්දේ වෙනත් මූලාශ්‍රයන්ගෙන් ලබාගත් තොරතුරු උපයෝගී කර ගැනීමෙනි.

ඉහත සඳහන් කළ දෙවැනි හා තුන්වැනි දුෂ්කරතාවයන් එකම සාධකයක් පාදක කොට ගෙන පැන නැගි ඒවා ලෙස හැඳින්වීම නිවැරදි යයි සිතමි. එනම්, ජාතියේ සාහිත්‍යය සංරක්ෂණය කිරීම සඳහා ජාතික පුස්තකාලයක් නොතිබීමයි. අපේ අනාගත පරපුරේ ප්‍රයෝජනය සඳහා ජාතියේ ලිඛිත සාහිත්‍යය එක්රැස්කොට තැබීම හා ආරක්ෂා කිරීම ජාතියේ පරම යුතුකමක් හා වගකීමක් වෙයි. අපේ තරුණ පරපුර රටක් ගමක් නැති අන්දමන්ද වූ නරුම පරපුරක් බවට පත්වීමෙන් වැළැක්විය හැක්කේ ඔවුනට දෙපා රඳවා ගැනීම පිණිස ශක්තිමත් පදනමක් තනා දීමෙන් පමණි. මේ කාර්යය ඉටුකිරීම පිණිස ගතයුතු මූලික පියවරක් වන ජාතික පුස්තකලයක් ආරම්භ කිරීමට ප්‍රමාදවී හෝ විධිවිධාන යොදා තිබීම අප හැමගේම සතුටට හේතුවිය යුතු කරුණකි.

මාර්ටින් වික්‍රමසිංහයන් විසින් රචිත ලිපි මෙන්ම ඔහුගේ ලිපි හා කෙටිකථා ආදියේ පරිවර්ථන රාශියක්ම විදේශීය පුවත්පත් හා සඟරාවල පළවී ඇත. පුවත්පත් හා වාර සඟරා කිහිපයකම මෙබඳු ලිපි ලේඛන පළවූ බවට වාර්තා වී ඇත. එහෙත් එම ලිපි පරීක්ෂා කිරීමට හෝ ඒවා පිළිබඳව තොරතුරු සොයාගැනීමට හෝ නොහැකි විය.

මාර්ටින් වික්‍රමසිංහයන් විසින් දේශීය පුවත්පත්වලට සපයන ලද ලිපි සංඛ්‍යාව මෙයට වඩා බෙහෙවින් අධිකය. දිනමිණ පුවත්පතේ උප කර්තෘ ධූරයේ හා ප්‍රධාන කර්තෘ ධූරයේත් 'ලක්මිණ' හා 'සිළුමිණ' පුවත්පත්වල කර්තෘ ධූරවලත් සේවය කරමින් වර්ෂ 27 ක කාලයක් පුරා ඔහු විසින් එම

පුවත්පත් වලට සපයන ලද කතුවැකි සංඛ්‍යාව ඉතා විශාලය. එහෙත් එම කතුවැකි මෙම ග්‍රන්ථ නාමාවලියට ඇතුළත් නොකරන ලදී. මෙම නාමාවලියට ඇතුළත් කිරීම සඳහා තෝරාගන්නා ලද්දේ කතෘත්වය නියත වශයෙන්ම ස්ථාපිත කිරීමට හැකිවූ ලේඛන පමණකි. ලක්මිණ පුවත්පතට ඔහු විසින් සපනය ලද අධිකරණ ප්‍රවෘත්ති වැනි විශේෂාංග මෙම නාමාවලියට ඇතුළත් නොකරන ලද්දේ කතෘත්වය සනාථ කිරීමට නියත සාධක ලබාගත නොහැකි වූ නිසාය. එහෙයින් මෙම ග්‍රන්ථ නාමාවලියට ඇතුළත් වී ඇත්තේ ඔහු විසින් සිංහල හා ඉංග්‍රීසි භාෂාවලින් රචිත ග්‍රන්ථත්, සිය පුද්ගල නාමයෙන් හා M. W., විජිත මනුවර්ණ, හේතුවාදී මයුරපාද* යන ආරූඪ නම්වලින් පුවත්පත් හා වාර සඟරාවලට සැපයූ ලිපිත්ය.

වෙනත් භාෂාවලට පරිවර්තනය කර පළකරන ලද ඔහුගේ ග්‍රන්ථ පිළිබඳ තොරතුරු ද මෙම ග්‍රන්ථ නාමාවලියට ඇතුළත් වේ.

මෙම ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය ප්‍රධාන කොටස් 3 කට බෙදා ඇත. එනම් සිංහල කෘති, ඉංග්‍රීසි කෘති හා වෙනත් භාෂාවලින් පළවූ කෘති යනුවෙනි. මෙයින් පළමුවන හා දෙවන් කොටස් යළිත් අනු කොටස් 3 කට බැගින් බෙදා ඇත. මාර්ටින් වික්‍රමසිංහ ශූරීන්ගේ ලේඛන පිළිබඳ විස්තරාත්මක සංලේඛ කාලානුරූප පිළිවෙල යටතේ ප්‍රථම අනු කොටසෙහි ඉදිරිපත් කෙරෙයි. දෙවන හා තෙවන අනු කොටස් නම් පිළිවෙලින් ග්‍රන්ථ නාම හා ලිපි ශීර්ෂ සූචියත්, විෂය සූචියත්ය.

ප්‍රථම අනු කොටසට ග්‍රන්ථ හා ලේඛන පිළිබඳව විස්තරාත්මක සංලේඛ ඇතුළත් වෙයි. එම සංලේඛ සකස් කොට ඇත්තේ 1975 දී අන්තර්ජාතික පුස්තකාල සංගම් සංවිධානය International Federation of Library Associations (IFLA) විසින් සම්මත කරනු ලැබූ අන්තර් ජාතික ප්‍රමිති ග්‍රන්ථ විස්තර (International Standard Book Description (Monographs) ISBD (M) සහ අන්තර් ජාතික ප්‍රමිත වාර සඟරා විස්තර International Standard Book Description (serials) ISBD (S) ප්‍රමිතීන්ට අනුකූලවය. එහෙත් ප්‍රස්තුත කාර්යයට අදාල නොවේ යැයි හැඟී ගිය තොරතුරු සංලේඛවලින් ඉවත් කරන ලදී. නිදසුනක් ගතහොත් ප්‍රසිද්ධ පුවත්පත් හා වාර සඟරා සඳහා වූ සංලේඛ වලට ප්‍රකාශන තොරතුරු ඇතුළත් නොවේ. අවශ්‍යතාවයන් අනුව සංලේඛවල ආකෘතියේද සුළු වෙනස්කම් කිහිපයක් කරන ලදී. පුවත්පත්වල පළවූ ලිපි සම්බන්ධයෙන් පිටු අංකයට අතිරේකව තීරු අංක දක්වන ලද අතර පිටු අංක හා තීරු අංක දෙතිතක් (:) මගින් වෙන්කර ඇත. පොත් සඳහා වූ සංලේඛ වලදී පොතේ පිටු අංක පිළිබඳ විස්තරයෙන් චිත්‍ර පිළිබඳ විස්තරය වෙන් කිරීමට ද දෙතිත (:) යොදාගෙන ඇත. මෙවැනි සුළු වෙනස්කම් ග්‍රන්ථ හා ලේඛන විස්තර ඉදිරිපත් කිරීමේ පහසුව තකා කරන ලද ඒවා වෙයි. සංලේඛ අග සටහන් යෙදීම හැකිතාක් අඩු කරන ලදී. සටහන් දී ඇත්තේ අත්‍යාවශ්‍ය අවස්ථාවල පමණි. හඳුනා ගැනීමේ පහසුව තකා සටහන් කුඩා අකුරින් මුද්‍රණය කර ඇත.

මෙම නාමාවලියේ දෙවන අනු කොටස වන ග්‍රන්ථ නාම හා ලිපි ශීර්ෂ සූචිය එක්තරා ප්‍රමාණයකට විෂය සූචියක් ලෙසද ක්‍රියා කරයි. මෙම හැකියාව විෂය සූචියට ලබාදෙන ලද්දේ විෂයානුකූල ළඟාවීම පහසු කරවීම පිණිසය. සියලුම විෂය ශීර්ෂවලට ප්‍රමුඛත්වය ලැබෙන අයුරින් වැදගත් විෂය ශිර්ෂයන් මුලට සිටින සේ වචන ගලපා සකස් කරන ලද ලිපි ශීර්ෂ මෙම සූචියට ඇතුළත් වෙයි.

පුවත් පත් හා වාර සඟරා ලිපි මෙන්ම ග්‍රන්ථවල පරිච්ඡෙද නාමයන්ද මෙම සූචියට ඇතුළත්ය. ග්‍රන්ථ වල පරිච්ඡේද නාමයන් ග්‍රන්ථය සඳහා වූ සංලේඛයට යොමුකර ඇති අතර එම සටහන්වලට අදාල සංලේඛ අංක වරහන් තුළ දක්වා ඇත. ග්‍රන්ථ සඳයා වූ සූචි සටහන් හඳුනා ගැනීමේ පහසුව පිණිස තද කළු අකුරින් මුද්‍රණය කර ඇත.

විෂය සූචියකින් තොරව මෙම ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය සම්පූර්ණ එකක් බවට පත්කළ නොහැකි බව පෙනී ගිය හෙයින් මෙයට විෂය සූචියක් ද එක්කරන ලදී. විෂය ක්ෂේත්‍ර රාශියක් තුළ ක්‍රියාත්මක වූ මාර්ටින් වික්‍රමසිංහයන්ගේ කෘතීන් පිළිබඳ නාමාවලියක් සැකසීමේදී විෂය සූචියක් ඇති

---

* හේන්පිටගෙදර ඥාණසීහ හිමියන් විසින් ද 'මයුරපාද යන ආරූඪ නාමය අවස්ථා දෙකකදී යොදා ගෙන ඇති බව පෙනේ. එම හිමියන් විසින් මයුරපාද නමින් 1946 හා 1948 වර්ෂවලදී පොත් දෙකක් පළකර ඇත. එහෙත් පුවත්පත් හෝ වාර සඟරා වලට සැපයූ කිසිදු ලිපියක උන්වහන්සේ විසින් එම ආරූඪ නාමය යොදාගෙන නැත. පුවත්පත් කලාවේදියෙකු වශයෙන් මයුරපාද නාමය යොදාගත් එකම පුද්ගලයා වූයේ මාර්ටින් වික්‍රමසිංහ ශූරීන්ය.

වැදගත්කම ගැන අමුතුවෙන් කිවයුතු නොවේ. එපමණක් නොව ඔහු විසින් විශේෂයෙන්ම පුවත්පත් වලට සපයන ලද ලිපිවල ශීර්ෂ මගින් බොහෝ විට එම ලේඛනයට විෂය වී ඇති ක්ෂේත්‍රය කුමක්ද යන්න ගැන අවබෝධයක් ලබා ගැනීම දුෂ්කර වීම ද විෂය සූචියක අවශ්‍යතාවය වඩාත් බල කරවූ සාධකයක් විය.

විෂය සූචියේදී යොදා ගන්නා ලද ඇතැම් විෂය ශිර්ෂයන් සපයා ගැනීමේදී බෙහෙවින් පොදු ජන ව්‍යවහාරය වෙතට අවධානය යොමු කිරීමට සිදුවිය. එවැනි ශීර්ෂ යොදා ගන්නා ලද්දේ පොදු ජන භාවිතයේ පවත්නා වචන අතුරින් විනා ඒවායේ ගැඹුරු ශාස්ත්‍රීය අරුත් සළකා බලා නොවේ. ඒ නිසා මෙම සූචිය ගැඹුරින් පරීක්ෂා කරන්නෙකුට ඇතැම් විට නොගැලපෙන විෂය ශීර්ෂයක් හමුවිය හැකිය. එහෙත් ගැඹුරින් බලා ස්ථිර විග්‍රහයක් කළ නොහැකි එබඳු විෂය ශීර්ෂයක් එහි භාවිතාර්ථය සළකා බලා මෙයට ඇතුළත් කරන ලදී.

විෂය සූචිය සිංහල බසින් මෙන්ම ඉංග්‍රිසි බසින්ද වෙන් වෙන්ව සම්පාදනය කරන ලද්දේ ඉංග්‍රීසි උගතුන්ට මෙන්ම සිංහල උගතුන්ටද විවිධ විෂය ක්ෂේත්‍රයන් තුල මාර්ටින් වික්‍රමසිංහ ශූරීන් ක්‍රියාකාරී වූ ආකාරය පිළිබඳව දල චිත්‍රයක් පහසුවෙන් මවා ගැනීමට අවස්ථාව සළසනු පිණිසය. මේ නිසා විෂය සූචිය මගින් භාෂා භේදයක් නියමුවක් ඇතුළත් නොවේ.

මෙම ග්‍රන්ථ නාමාවලිය සම්පාදනයේදී ග්‍රන්ථ හා ලේඛන පරීක්ෂා කිරීම පිණිස පුස්තකාල මෙන්ම පෞද්ගලික ග්‍රන්ථ එකතුන් රාශියක් ද පරිශීලනය කිරීමට සිදුවිය. මාර්ටින් වික්‍රමසිංහයන්ගේ පෞද්ගලික පුස්තකාලය, රාජ්‍ය ලේඛනාගාර දෙපාර්තමේන්තුව, කොළඹ කෞතුකාගාර පුස්තකාලය, කොළඹ මහජන පුස්තකාලය, ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ පේරාදෙණිය, කොළඹ හා විද්‍යෝදය මණ්ඩපවල පුස්තකාල, ටයිම්ස් , ඇත්ත, ඥානාර්ථ ප්‍රදීපය යන පුවත් පත් කාර්යාලවල පුස්තකාල හා සෝවියට් සංස්කෘතික මන්දිරයේ පුස්තකාලයද එයින් සමහරකි. මෙම ආයතන ප්‍රධානීන්ගේ හා ඔවුන්ගේ කාර්ය මණ්ඩලවල නොමසුරු සහයෝගය නිසා නොවේ නම් මෙම ග්‍රන්ථ නාමාවලිය බිහි නොවන්නට ඉඩ තිබිණි.

මෙබඳු ග්‍රන්ථ නාමාවලියක අවශ්‍යතාවය පිළිබඳව අවධාරණය කොට මේ කාර්යය සඳහා මා මෙහෙයවූ සුනිල් ගෝවින්නගේ මහතාටත් ග්‍රන්ථ නාමාවලි සම්පාදන කාර්යයේ ආරම්භයේ සිට අවසානය දක්වාම විවිධ අයුරින් මග පෙන්වීමෙන් හා ධෛර්යය දීමෙන් මට සහායවූ දොස්තර රංග වික්‍රමසිංහ මහතාටත් මගේ කෘතඥතාවය පළකරනු කැමැත්තෙමි.

මෙම ග්‍රන්ථ නාමාවලිය සම්පාදනයේදී මෙම ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් දෙදෙනෙකුගේ උපදෙස් ලබා ගැනීමට හැකිවීම මට මහත් ධෛර්යයක් විය. ඒ දෙදෙනා නම් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයේ පේරාදෙණි මණ්ඩපයේ පුස්තකාලයාධිපති එච්. ඒ. අයි. ගුණතිලක මහතාත්, ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ ඇන්. අමරසිංහ මහතාත්ය. අත් පිටපත පරීක්ෂා කිරීමෙන් හා උපදෙස් දීමෙන් අනුග්‍රහ දක්වූ ඒ මහතුන්ට මගේ කෘතඥතා පූර්වක ස්තුතිය පුදකරමි.

සම්පාදක ලෙස එක් අයෙකුගේ නම පමණක් සඳහන් වුවද ඇත්ත වශයෙන්ම මෙම ග්‍රන්ථ නාමාවලිය සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයක් ලෙස හැඳින්වීම නිවැරදිය. කුසුම්සිරි පෙරේරා, ශාන්ති ප්‍රනාන්දු, ජයලතා වීරසිංහ, රෝහිණී ජයවර්ධණ, ගර්ලි විමලදාස හා පී. ඒ. චන්ද්‍රකුමාර යන මහත්ම මහත්මීන් ලේඛන පරීක්ෂා කිරීම සඳහා මට සහාය වූහ. මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා උද්‍යොගයෙන් කටයුතු කළ ඔවුන් සියලුදෙනාටත්, අත් පිටපත යතුරු ලියනය කර දීමෙන් සහාය වූ ජී. ඩී. දයානන්ද මහතාටත් මගේ විශේෂ ස්තුතිය හිමිවිය යුතුය.

මෙම නාමාවලිය මුද්‍රණය කොට පළ කිරීමට භාර ගැනීමෙන් අනුග්‍රහය දක්වූ මාර්ටින් වික්‍රමසිංහ භාරකාර මණ්ඩලයටත් මෙය ඉතා ශෝභන අයුරින් මුද්‍රණය කරදුන් දෙහිවල තිසර මුද්‍රණාලයේ අධිපති ඇතුළු කාර්ය මණ්ඩලයටත් මගේ කෘතඥතාවය පළකරමි.

ධනපාල ගුණසේකර
ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය,
කොළඹ 4.

''අවුරුදු දෙදහසකට වඩා පැරණි භාෂාවක්, සංස්කෘතියක්, උසස් ආගමක් හා අවුරුදු දහසකට වඩා පැරණි අවිච්ඡින්න සාහිත්‍යයක් ද දායාද කොට ගත් අපට පරගැතිකම් උපයෝගී කොට ගැනීමට උවමනාවක් නැත. බටහිර ජාතීන් හා අත්වැල් බැඳගෙන උරෙන් උර ගැටෙමින් හෝ ස්වාධීනව දියුණු වීමට උවමනා පැරණිතම නිදහස් සම්ප්‍රදායක් අපට ඇත. ඒ සම්ප්‍රදාය අප ලැබුවේ බුදු සමයෙනි......''

- මාර්ටින් වික්‍රමසිංහ-

# මාර්ටින් වික්‍රමසිංහ

මෙම ග්‍රන්ථ නාමාවලිය සැකසීමේදී, මාර්ටින් වික්‍රමසිංහ ශූරීන්ගේ කෘතීන් අතරින් සොයාගත හැකිවූ ග්‍රන්ථ හා ලේඛන සියල්ලම පරීක්ෂා කිරීමට සිදුවිය. මෙම ලේඛන පරීක්ෂාවේදී හමුවූ ඇතැම් තොරතුරු මාර්ටින් වික්‍රමසිංහයන් පිළිබඳවත් ඔහුගේ කෘතීන් හා තත්කාලීන සාහිත්‍ය ක්ෂේත්‍රය පිළිබඳවත් අධ්‍යයනයක නියැලෙන්නකු විසින් පරිශ්‍රමයක් යොදා සොයාගත යුතු ඒවාය. මෙම නිබන්ධනයේ අරමුණ වන්නේ අතිරේක අභ්‍යාසයකින් තොරව හමුවූ එබඳු පසුබිම් තොරතුරු කිහිපයක් කෙරෙහි පාඨකයාගේ අවධානය යොමු කිරීමය.

විසිතුන් හැවිරිදි තරුණයෙකු ලෙස ලේඛන කාර්යයට බට මාර්ටින් වික්‍රමසිංහයන්ගේ ප්‍රථම කෘතිය වූයේ 1914 දී පළ කරන ලද 'ලීලා' නවකතාවයි. ඊට දස වසරකට පෙර, එනම් 1903 දී 'බාලොපදේශය' නමැති පද්‍ය ග්‍රන්ථයක් ද ඔහු විසින් පළකර තිබිනි. එහෙත් එහුගේ 'උපන්දා සිට' නම් වූ මතක සටහන් පොතෙහි හෝ වෙනත් කිසිදු ලේඛනයක මෙම ග්‍රන්ථය පිළිබඳව සඳහන් කර නැත. තවද 1903 - 1914 කාල පරිච්ඡේදය තුළ ඔහු විසින් පළකරන ලද වෙනත් ලේඛනයක්ද සොයාගත නොහැකිවූ හෙයින් ''ලීලා'' නවකථාව ඔහුගේ ප්‍රථම කෘතිය ලෙස සැලකීම සුදුසුය.

මේ අනුව ඔහුගේ ලේඛක ජීවිතය 1914 සිට 1975 දක්වා වූ වර්ෂ 60 ක කාල පරිච්ඡේදයක් පුරා පැතිර ගිය එකක් විය. මෙම කාල පරිච්ඡේදය, තොරතුරු ඉදිරිපත් කිරීමේ පහසුව තකා කොටස් තුනකට වෙන්කර ගත හැක. එනම්,

1. පුවත්පත්වලට ලිපි සැපයීම මගින් ආධුනික පුවත්පත් කලාවේදියකු ලෙස කටයුතු කළ මුල් අවධිය (1914-1920)

2. පූර්ණ කාලීන පුවත්පත් කලාවේදියකු වශයෙන් ගතකළ මධ්‍ය අවධිය (1920-1946)

3. පූර්ණ කාලීන ලේඛකයකු වශයෙන් ගත කළ පශ්චාත් අවධිය (1946-1975)

මෙම එකද අවධියකදීවත් මාර්ටින් වික්‍රමසිංහ සම්පූර්ණ වශයෙන් පුවත්පත් කලාවෙහි පමණක් හෝ ලේඛක වෘත්තියෙහි පමණක් හෝ නියැළුනු බවක් මෙම බෙදීම මගින් අදහස් නොකෙරේ.

## මුල් අවධිය (1914 - 1920)

1914 දී නවකථා කරණය තුළින් ලේඛක ජීවිතය ආරම්භ කළ නුමුදු මෙ අවධිය තුළදී සිංහල පාඨකන් අතර ඔහු වඩාත් ප්‍රකට වූයේ පුවත් පත් කලාවේදියෙකු ලෙසිනි. වර්ෂ 2 ක් තුළදීත් 'ලීලා' නවකථාවෙන් පිටපත් 300 කට වඩා අලෙවි නොවූ බව පසු කලෙක ඔහු විසින් ම සඳහන් කර ඇත. (උපන් දා සිට - පි. 134) ඔහුගේ දෙවන කෘතිය වූ ශාස්ත්‍රීය ලේඛන 1919 දී නිකුත් විය. මෙම කෘතියෙන් පිටපත් 2000 ක් මුද්‍රණය කරන ලද නමුදු එම පිටපත් සියල්ලම අලෙවි වීමට කොපමණ කල් ගියේද යන්න දැනගැනීමට සාධකයක් නැත. එසේ වුවද එම ග්‍රන්ථය පිළිබඳව ඔහුගේ පශ්චාත් ලේඛනවල සඳහන් නොකිරීමෙනුත්, එහි යළි මුද්‍රණයක් නිකුත්කර නොතිබීමෙනුත් පෙනී යන්නේ එම ග්‍රන්ථය ද පාඨකයින් අතර ජනප්‍රිය නොවූ බවය.

1914 - 1920 කාල පරිච්ඡේදය තුළදී පුවත්පත් කලාවේදියෙකු ලෙස සිංහල පාඨකයන් හමුවට ඔහු පැමිණියේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ දෛනික ප්‍රකාශනයක් වූ දිනමිණ පුවත්පත තුළිනි. සිව් වසරක්ම මෙම කාලය තුළ එම පුවත්පතට ඔහු විසින් වරින්වර සපයන ලද ලිපි සංඛ්‍යාව 41 කි. ඔහුගේ පුවත්පත් කලාවේදී ජීවිතයේ මෙන්ම ලේඛක ජීවිතයේ ද පශ්චාත් යුගයේ දැකගත හැකිවූ ප්‍රවණතාවයන් කිහිපයකම මූලාවස්ථාව මෙම සිව් වසර තුළ ඔහු දිනමිණට සැපයූ ලිපිවලින් පිළිබිඹු වේ.

මාර්ටින් වික්‍රමසිංහ පුවත්පත් කලාවේදී ජීවිතය ආරම්භ කළේ මෙරට ජාතික විමුක්ති ව්‍යාපාරය එහි උච්ච අවස්ථාව කරා ළඟා වෙමින් පැවැති අවධියකදීය. 18 වන සියවසේ ලන්දේසීන් විසින්

මෙරටට හඳුන්වා දෙන ලද මුද්‍රණ ශිල්පය මේ වනවට දේශීය ආගමික හා සංස්කෘතික ව්‍යාපාර විසින් තම ප්‍රචාරක කටයුතු සඳහා ප්‍රබල මෙවලමක් ලෙස උපයෝගීකොට ගෙන තිබුනි. ජාතික පුනර්ජීවන ව්‍යාපාරයේ පුරෝගාමී පියවර ලෙස හැඳින්විය හැකි දේශීය ආගමික ව්‍යාපාරය විසින්ද සිය ප්‍රචාරක කටයුතු සඳහා සම්පූර්ණයෙන්ම වාගේ උපයෝගී කොටගෙන තිබුණේ සිංහල පුවත්පත් හා වාර සඟරාය.

ඉන්දියාවේ මෙන්ම ලංකාවේද ජාතික නිදහස් සටන් ව්‍යාපාරය ආරම්භවූයේ දේශීය සංස්කෘතික පුනරුදයක ස්වරූපයෙනි. භාෂා සාහිත්‍යය උද්ඝෝෂණය මෙම ව්‍යාපාරයෙහි ඉතා ප්‍රබල අංගයක් විය. ඉන්දියාවේ ගාන්ධි, නේරු ආදීන්ගේ නායකත්වයෙන් ඇරඹි ව්‍යාපාරයට සමාන්තර ව්‍යාපාරයක් අනගාරික ධර්මපාල වැනි ලංකාවේ ද්විභාෂා උගතුන් කිහිපදෙනෙකුගේ මූලිකත්වයෙන් පවත්වාගෙන යන ලදී. දේශීය ආගමික ප්‍රචාරක ව්‍යාපාරය මෙන්ම මේ යුගයේ කැපී පෙනුනු සිංහල භාෂා සාහිත්‍ය ප්‍රබෝධයද මත ජාතික විමුක්ති ව්‍යාපාරය පදනම් විය. පාලන තන්ත්‍රය හා කිසිදු සහභාගිත්වයකින් තොරව සිටි සිංහල පමණක් උගත් නාගරික හා ගැමි පරපුර වෙතට මෙම නව ප්‍රබෝධය ලඟා කරවීම සඳහා සිංහල පුවත්පත් හා වාර සඟරා ඉතාමත්ම ප්‍රබල මාධ්‍යයක් විය.

දේශීය ආගමික ව්‍යාපාරය විසින් මෙහෙයවන ලද විවිධ ආගමික විවාද පිළිබඳ වාර්තා මෙම පුවත්පත් හා වාර සඟරාවල පළවිය. මෙයට අතිරේක වශයෙන් සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිබඳව විවාද රාශියක්ම පුවත්පත් මගින් පවත්වාගෙන යෑමද මෙම ප්‍රචාරක ව්‍යාපාරයේ තවත් අංගයක් විය. විවාදාපන්න ඒකපක්ෂයක අදහස් ඉදිරිපත් කිරීම සඳහාම පුවත්පත් හා වාරසඟරා ආරම්භ කරන ලද අවස්ථාද දක්නට ඇත. 1845 දී බටුවන්තුඩාවේ පඬිතුමා ආරම්භ කළ 'යතලබ' සඟරාව මෙයට නිදසුනකි. මෙම පුවත්පත් හා වාර සඟරා ගැමි ජනතාව අතර ජනප්‍රිය වූ බවට කිසිදු සැකයක් නැත. ගැමි උගතුන් බොහෝ දෙනෙකු සාහිත්‍යය හා භාෂාව පිළිබඳ පුවත්පත් විවාදවලදී විවිධ මත පළකිරීම ඉතාමත්ම සුලභ සිද්ධියක් විය. ශාස්ත්‍රීය විවාද පිළිබඳව ඔවුන් දැක්වූ උනන්දුව හෙළිකරවන නිදසුනක් ලෙස මෙම කරුණු ඉදිරිපත් කළ හැකිය. ආගමික වාද විවාද මෙයට වඩා පුළුල් පිරිසක් අතර පැතිරුනු බව පෙනේ. නූගත් ගැමි ජනතාව පවා මෙම වාද විවාද පිළිබඳව තොරතුරු ගැන උනන්දුවක් දැක්වූහ. ධර්ම දේශනාවලදී භික්ෂූන් පවා මෙම කරුණු ගැන පොදු ජනතාවගේ කුතුහලය ඇවිස්සූහ. මේ අනුව ආගමික හා ශාස්ත්‍රීය ව්‍යාපාරයේ සාර්ථක ප්‍රචාරක මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම මෙන්ම පොදු ජනතාව තුළ කියවීමේ රුචිය නඟා සිටුවීම සඳහාද සිංහල පුවත්පත් හා සඟරා මගින් විශාල මෙහෙයක් ඉටුකොට තිබිනි. වෙනත් අන්දමකින් කිවහොත් ද්විභාෂා උගත් නාගරික උසස් පන්තියේ නායකත්වයෙන් බිහිව තිබූ තත්කාලීන සමාජ දේශපාලන සංවාදය ගැමි ජනතාව අතරට ගෙන යන ලද්දේ සිංහල පුවත්පත් හා වාර සඟරා මගිනි.

පුවත්පත් මගින් මෙ සංවාදයට ගැමි පරපුර සහභාගි කරවූයේ සීමාසහිත අන්දමකින් බව පෙනේ. පුවත්පත් මගින් ගෙනගිය ප්‍රචාරක ව්‍යාපාරයේ හොඳ ප්‍රතිඵල මෙන්ම දුර්විපාක ද කිහිපයක් විය. ඉන් කැපී පෙනෙන්නක් නම් ජාතික පුනර්ජීවන ව්‍යාපාරිකයන්ට අවශ්‍යවූ පරිදිම සිංහල පමණක් උගත් ජනතාවගේ අවධානයට ලක්කරන ලද විෂය ක්ෂේත්‍රය ඉතාමත්ම සීමිත එකක් වීමය. ආගමික හා සාහිත්‍ය පුනර්ජීවන ව්‍යාපාරයට නායකත්වය දෙන ලද්දේ ද්විභාෂා හැකියාව ලත් දේශීය නාගරික මධ්‍යම පන්තිය විසිනි. මෙම පන්තියේ සාමාජිකයෝ ඉංග්‍රීසි උගතුන් වූ අතර දේශීය අධ්‍යාපනයද ලත් අයවූහ. මොවුන්ගෙන් සුළු කොටසක් රැකියා අවශ්‍යතා ආදිය නිසා ගමෙන් නගරයට සංක්‍රමණය වූ අයවූහ. මොවුන්ගේ පුරෝගාමීත්වයෙන් ගෙනගිය තත්කාලීන සමාජ සංවාදයට සහභාගිවූ ගැමි ප්‍රබුද්ධ පරපුර දේශීය අධ්‍යාපනයේ ප්‍රතිඵල වශයෙන් බිහිවූ අය වූහ. පාඨශාලාචාර්යවරු, දේශීය වෛද්‍යවරු හා උගත් භික්ෂු පරපුරද මෙම පිරිසට අයත්වූ කොටස් කිහිපයකි.

මෙම ගැමි ප්‍රබුද්ධ පරපුර මෙන්ම ජාතික පුනර්ජීවන ව්‍යාපාරයේ පුරෝගාමී වූ උගත් නාගරික මධ්‍යම පන්තියේ අයද අප දේශීය සංස්කෘතිය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලද්දෝ නොවූහ. ඔවුහු තමන් නොදැනුවත්වම ඉන්දීය සකු සාහිත්‍ය ගුරුකුලවලත් ආචාර ධර්මවලත් අනුකාරකයන්ව සිටියහ. බටහිර ආචාර ධර්මවලටත් සංස්කෘතික අංගවලටත් එරෙහිව ඔවුන් සටන් පෙරමුණට යවන ලද්දේ ඔවුන්ගේ මෙම අනුකාරකත්වය විසිනි. බටහිර සිරිත් විරිත් ගරු කළ නාගරික ඉහළ මධ්‍යම පන්තියේ හරයන් හා ඇගයීම් දේශීය සංස්කෘතියට හානිකර බව දුටු ඔවුහු බටහිර ආගම් මෙන්ම බටහිර සංස්කෘතියද තදින් හෙළා දුටුවහ. ඔවුන් පිළිගත් අනුකාරක සංස්කෘතික අංග සියල්ල අවිචාරයෙන් හුවා දැක්වීම ඔවුන්ගේ ව්‍යාපාරයේ මුඛ්‍ය ලක්ෂණයක් විය. මෙම ශතකයේ මුල් භාගයේ සිංහල බෞද්ධයා පුවත්පතේ

පළවූ පියදාස සිරිසේන ආදීන්ගේ ලිපි මාලා මෙම ලක්ෂණවලට නිදසුනක් ලෙස දැක්විය හැකිය. මෙවැනි තත්ත්වයක් ඇතිවීමට මූලික හේතුව වූයේ ජාතික විමුක්ති ව්‍යාපාරිකයන්ගේ සීමිත ආකල්පයයි. ලාංකික ද්විභාෂා උගතුන්ගෙන් වැඩි දෙනෙකුට බටහිර සංස්කෘතිය පිළිබඳව ගැඹුරු අවබෝධයක් නොවීය. බටහිර සංස්කෘතිය ලෙස ඔවුන් දුටුවේ නාගරික උසස් මධ්‍යම පන්තිකයින් විසින් අවිචාරයෙන් අනුකරණය කළ බටහිර විලාසිතා ඇතුළු බාහිර අංග කිහිපයක් පමණි. බටහිර සංස්කෘතියෙහි හරවත් අංග දෙස ගැඹුරින් බැලීමටත්, එම අංගයන්ගෙන් දේශීය සංස්කෘතිය පෝෂණය කර ගතහැකි ආකාරය දැකීමටත් ඔවුහු අපොහොසත් වූහ.

බටහිර ලෝකයේ දියුණු වෙමින් පැවති විද්‍යාව, දර්ශනය වැනි විෂයයන් පිළිබඳව උනන්දුවක් දැක්වූ අය සුළු නාගරික ප්‍රබුද්ධ පරපුර තුළ සිටි නමුත් ඔවුන් විසින් මෙම විෂයයන් පිළිබඳව කරන ලද සාකච්ඡා මෙන්ම පළකරන ලද ලේඛනද ඉංග්‍රීසි මාධ්‍යයට පමණක් සීමා විය. නාගරික ඉහළ හා මධ්‍යම පන්තිවල ජනතාවගෙන් වැඩි කොටසක් හා ගැමි මධ්‍යම පන්තිකයන් විසින් ද මෙ ප්‍රවණතාවයන්ට කිසිදු ප්‍රතිචාරයක් නොක්දවන ලද අතර ඔවුහු බටහිර සංස්කෘතියේ බාහිරාංග අනුකරණය කිරීම මගින් තෘප්තියක් ලැබූහ. භාෂා බාධකය නිසා ගැමි ප්‍රබුද්ධ පරපුර මෙම ප්‍රවණතාවයන්ට ආගන්තුකයෝ වූහ. මෙම තත්ත්වයේ ප්‍රතිඵලය වූයේ බටහිර ලෝකයේ දියුණු වෙමින් තිබූ නව දැනුම දේශීය ජනතාව අතරට පැතිරීම වැළකීමය. ඔවුනට නව දැනුම හා තොරතුරු ලබාගැනීමට තිබූ එකම මාධ්‍යය සිංහල පුවත්පත් හා වාර සඟරා විය.

ආගමික විවාද වලදී එක් පුවත්පතක් හැමවිටම එක් පක්ෂයක අදහස් පමණක් නියෝජනය කිරීම නිසා එය ජනතාව තුළ සංවාදයක් ඇති කිරීමට වඩා ඒකපාක්ෂික ප්‍රචාරක ව්‍යාපාරයකට ළංවිය. තවද, මෙම පුවත්පත්වල පළවූ විවේචන වැඩි වශයෙන් නැඹුරු වූයේ ප්‍රස්තුත විෂය තුලනාත්මකව හා අපක්ෂපාතී ලෙස සාකච්ඡාවට භාජනය කිරීමට නොව ප්‍රතිවාදී පිලට බැණවැදීමටය. කෙසේ වුවද සිංහල පුවත්පත් හා සඟරා කියවන පාඨක පරපුරක් නගරයේ මෙන්ම ගමේද මේ වන විට බිහිවී තිබුනි.

මාර්ටින් වික්‍රමසිංහ සිය පුවත්පත් කලාවේදී ජීවිතය ආරම්භ කළේ මෙබඳු අවධියකදීය. එකිනෙකාගෙන් ඉතා දුරස්ථවූ අන්ත දෙකක සිටි දේශීය අනුකාරක පරපුරේත්, බටහිර අනුකාරක පරපුරේත් සහභාගිත්වය රටේ දේශපාලන සමාජ සංවාදයට ලබා ගැනීමේ වැදගත් කමත්, ඒ සඳහා පුවත්පත් හා වාර සඟරා උපයෝගී කරගත හැකි ආකාරයත් පිළිබඳව මනා අවබෝධයක් මාර්ටින් වික්‍රමසිංහයන් සතුවිය. තවද, ජාතික පුනර්ජීවන ව්‍යාපාරය මගින් කරගෙන ගිය සමාජය ඉතිහාසය වෙතට යළි කැඳවා ගෙන යාමට දරන ලද ප්‍රයත්නයේ නිෂ්ඵල බවද ඔහු විසින් මැනැවින් වටහා ගෙන තිබිණි.

අනුකාරක බවින් මිදුණු ජනතාවක් බිහි කිරීමෙන් තොරව ස්වාධීන නව සමාජයක් ගොඩ නැංවිය නොහැකි  බව ඔහු විසින් අවබෝධ කරගෙන තිබුනි. සංස්කෘතිය කෞතුක වස්තුවක් මෙන් එකම ස්වරූපයකින් ආරක්ෂා කිරීමට දරන ලද ප්‍රයත්නයේ අර්ථ විරහිත බව සමකාලීනයන් අතරින් ප්‍රථම වරට පෙන්වා දෙන ලද්දේ මාර්ටින් වික්‍රමසිංහයන් විසිනි.

සංස්කෘතිය නිරන්තරයෙන් වැඩෙන, විවිධ බලපෑම්වලින් පෝෂණය ලබමින් ඉදිරියට යන එකක් විය යුතුය. දේශීය අනුකාරක සංස්කෘතික ව්‍යාපාරයන් විසින් මියගිය සංස්කෘතියක් හුවා දැක්වීමට දැරූ ප්‍රයත්නය නිසි මග මෙහෙයවීමට නම් පළමුකොටම කළයුතුව තිබුනේ දේශීය සංස්කෘතිය කුමක්දැයි හඳුනා  ගැනීමය.

හුදෙක් සම්ප්‍රදායික ඉතිහාස කථාවන් ඇසුරින් හෝ අනුකාරක සිරිත් විරිත් හා වත් පිළිවෙත් තුලින් හෝ ජන සංස්කෘතිය පිළිබඳ අවබෝධයක් ලබාගත නොහැකි බව ප්‍රථම වරට සාක්ෂාත් කොටගත් ලාංකික පුවත්පත් කලාවේදියා වූයේද මාර්ටින් වික්‍රමසිංහය. ජාතික විමුක්ති ව්‍යාපාරිකයන්ට නොතිබුනු මෙම අවබෝධය විසින් ජාතික සංස්කෘතිය පිළිබඳව ඉගෙනීමට ඔහු මෙහෙයවන ලද බව සිතිය හැකිය. මෙතෙක් කලක් ජාතික පුනර්ජීවන ව්‍යාපාරයේ අතකොළු වශයෙන් පමණක් සිටිමින් දේශීය අනුකාරක සංස්කෘතිය ජාතික සංස්කෘතිය ලෙස පිළිගැනීමට බලකරනු ලැබ සිටි ප්‍රබුද්ධ ගැමි පරපුරෙහි ක්‍රියාශීලී සහභාගිත්වය රටේ සමාජ දේශපාලන සංවාදයට ලබාගැනීමට ඇති ඒකායන මාර්ගය වූයේ දේශීය සංස්කෘතිය පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබාදීමෙන් පමණක් බව ඔහු විසින් තේරුම් ගෙන තිබිණි.

මෙම අවබෝධය ලබාගැනීම සඳහා බටහිර යුරෝපයේ දියුණු වෙමින් පැවති විෂයයක් වන විද්‍යාඥානය හා මානව විද්‍යාව ඔහු උපයෝගී කර ගත්තේය. ජනතාවගේ භාෂාව හා සාහිත්‍යය ඔවුන්ගේ සිතුම් පැතුම් හා සාරධර්මයන් වටහා ගැනීමට ප්‍රබල මෙවලමක් ලෙස උපයෝගී කරගත හැකි ආකාරය තේරුම් ගැනීමෙහි ප්‍රතිඵලය වූයේ භාෂා හා සාහිත්‍යය පිළිබඳව අධ්‍යයනය කිරීමට ඔහු පෙළඹීමයි.

මාර්ටින් වික්‍රමසිංහයන්ගේ මෙම ප්‍රවණතාවය විසින් සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයේ ප්‍රගතියට මහත් සේවාවක් ඉටුකරන ලද අතර එම සේවාව පිළිබඳව සමකාලීන මෙන්ම පශ්චාත් සාහිත්‍ය විචාරකයන්ගේද අවධානය යොමුවිය. එහෙත් ඊට පිටුපසින් දිවෙන, සිංහල සංස්කෘතියේ පෝෂණය කෙරෙහි ඔහු කළ බලපෑම පිළිබඳව තවමත් ප්‍රමාණවත් ඇගයීමක් කර නැත.

ගැමි ප්‍රබුද්ධ පරපුර දේශීය අනුකාරක සංස්කෘතියේ මෙන්ම බටහිර සංස්කෘතිකාංගයන්ගේ අනුකාරකයින් පිරිසක්වීම වැළැක්වීමට නම් නව දැනුම ලබාදීම මගින් ඔවුන්ගේ විෂය ඥානය පුළුල් කිරීම අත්‍යවශ්‍ය බව මාර්ටින් වික්‍රමසිංහ විසින් අවබෝධ කරගෙන තිබුණි. මේ බවට ඔහුගේ මුල් අවධියේ ලේඛන නිදසුන් සපයයි.

ඉංග්‍රීසි බසින් ලිවීම විලාසිතාවක් බවට පත්ව තිබුනු යුගයක සිංහල පුවත්පත් කලාවේදියෙකු වීමට ඔහු පොළඹවන්නට ඇත්තේද මෙම අවබෝධය විසින් විය යුතුය.

යුරෝපයේ ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පැවති විද්‍යා හා තාක්ෂණික ඥානය පිළිබඳ හැඳින්වීමක් කිරීම පමණක් නොව, මානව විද්‍යා ක්ෂේත්‍රයන් ගැනද තොරතුරු දේශීය භාෂා උගත් ජනතාවට සැපයීම මගින් මෙම විෂයයන් පිළිබඳව ඔවුන් තුළ හැඟීමක් ඇති කිරීමටත්, ජාතික සංවර්ධනය උදෙසා මෙම නව දැනුමෙන් ප්‍රයෝජන ලබා ගත යුතු බවට ජනතාවට අවබෝධයක් ලබාදීමටත් ඔහු කටයුතු කළේය. මේ මගින් ප්‍රබුද්ධ පාඨක පරපුරක් ගොඩනැංවීම පමණක් නොව නොගැඹුරු මට්ටමකින් ගෙනගිය ජාතික සංස්කෘතිය හුවා දැක්වීමේ ආකල්පය වෙනස් කිරීමටද ඔහු විසින් තීරණාත්මක ලෙස පෑ බව පෙනේ.

1916 - 20 කාලය තුළ ඔහු දිනමිණ පුවත්පතට සැපයූ ලිපි ප්‍රධාන වශයෙන්ම උපයෝගී කොටගෙන ඇත්තේ මෙම පරමාර්ථය ඉටුකර ගැනීම සඳහාය.

නව තොරතුරු ජනතාවට සැපයීම මෙන්ම ජනතාවගේ දැනුම දියුණු කිරීම සඳහාද, ජනතාව අතර සංවාදයක් ඇති කිරීම සඳහාද, පුවත්පත ප්‍රබල මාධ්‍යයක් වෙයි. එහෙත් ජනතා දැනුම වර්ධනය කිරීම සඳහා මෙම මාධ්‍යය සිංහල පුවත්පත් විසින් ප්‍රමාණවත් අයුරින් උපයෝගී කරගෙන නොතිබුණු බැව් ඉහත් සඳහන් කොට ඇත. මෙයට හේතුව වූයේ 20 වන සියවසේ මුල භාගය වන විට කෙමෙන් දේශපාලන ව්‍යාපාරයක් බවට පත්වෙමින් තිබුණු ජාතික පුනර්ජීවන ව්‍යාපාරය විසින් ගැමි ජනතාවගේ අවශ්‍යතාවයන් පිළිබඳව වටහාගැනීමට අසමත්වීමය. ඒ සඳහා උවමනාවක්ද ජාතික විමුක්ති ව්‍යාපාරය මෙහෙයවූ දේශපාලන නායකයින්ට නොතිබිනි.

බටහිර ඥාන සම්භාරයෙන් බිඳක් දේශීය භාෂා උගත් ජනතාව අතට පත්කිරීම පිණිස මාර්ටින් වික්‍රමසිංහන් ගත් පියවර ඉතාමත්ම කාලෝචිත වූද, ප්‍රබුද්ධ ගැමි ජනතාවගේ අවධානයට ලක්වූද එකක්විය.

චාල්ස් ඩාවින් විසින් විද්‍යා ලෝකයට හඳුන්වා දුන් 'පරිණාමවාදය' පිළිබඳව 1916-1917 වර්ෂවල ඔහු දිනමිණ පුවත්පතට ලිපි පෙළක් සැපයීය. ජාතික නිදහස් ව්‍යාපාරය මෙන්ම දේශීය ආගමික ප්‍රචාරක ව්‍යාපාරයක ඉතා උච්ච තත්ත්වයක පැවතුනු මෙම අවධියේ ජනතාවගේ අවධානය ඒ දෙසට තදින් යොමුව තිබුනි. එහෙයින් පරිණාමවාදය පිළිබඳ තොරතුරු සිංහල පමණක් උගත් පාඨකයින්ට පමණක් නොව ඉංග්‍රීසි උගත් පාඨකයින් බොහෝ දෙනෙකුට පවා අලුත් විෂයයක් වන්නට ඇති බව සිතිය හැකිය.

මෙම යුගයේ ඉංග්‍රීසි පාඨක රුචියේ ප්‍රවණතාවයන් පිළිබඳව නිගමනයකට එළඹීමට ප්‍රමාණවත් සාධක නොමැති නමුත් මෙම යුගයේ ජීවත්වූ ජනප්‍රිය ලේඛකයන් හා කවීන් සිය ග්‍රන්ථ කරණය සඳහා මූලාදර්ශ කොටගෙන තිබූ බටහිර සාහිත්‍ය කෘතීන් දෙස බැලීමෙන් එම ප්‍රවණතාවයන් පිළිබඳවද දළ අදහසක් ඇති කරගත හැකිය. එනම්, වික්ටෝරියානු ප්‍රේමාලාප සාහිත්‍යය මේ යුගයේ ලාංකික ඉංග්‍රීසි

උගත් මධ්‍යම පන්තිය තුළ ඉතා ජනප්‍රියව තිබුනු බවට ඔවුන් විසින් රචිත නවකථා හා කාව්‍යයන් සාධක සපයයි.

මාර්ටින් වික්‍රමසිංහයන්ගේ පරිණාම වාදය පිළිබඳ ලිපි පෙළත්, මෙම අවධියේම ඔහු දිනමිණ පුවත්පතට සැපයූ වෘක්ෂලතා හා සත්ත්වයෝ ලිපි පෙළත් සිංහල උගත් ප්‍රබුද්ධ පාඨක ජනතාවගේ අවධානයට ලක් වීමට ප්‍රධාන හේතුව වන්නට ඇත්තේද ඔහු තෝරාගත් විෂයයේ නවතාවය විය යුතුය. පරිණාම ධර්මය ලිපි පෙළ මෙන්ම වෘක්ෂලතා හා සත්ත්වයෝ ලිපි පෙළද ලිපි 4 කින් සමන්විත විය. එම ලිපි විවේචනය කරමින් දිනමිණ පුවත්පතේම පළවූ ලිපි සංඛ්‍යාව පිළිවෙලින් 5ක් හා 8ක් විය. මෙයට අතිරේකව සිංහල බෞද්ධයා ඇතුළු තත්කාලීන පුවත්පත් හා සඟරා කිහිපයකද පරිණාමවාදය පිළිබඳව මාර්ටින් වික්‍රමසිංහයන්ගේ අදහස් විවේචනය කරමින් ලිපි පළවී තිබුනි. මෙම ලිපි සැපයූවන් අතර පාඨශාලාචාර්යවරු භික්ෂූන් වහන්සේලා මෙන්ම දේශීය භාෂා උගතුන් කිහිපදෙනෙකුම වූහ. පුවත්පත් මාධ්‍යයෙන් දේශීය භාෂා උගත් ප්‍රබුද්ධ පාඨක පිරිස ඇමතීමට මාර්ටින් වික්‍රමසිංහ දැරූ ප්‍රයත්නය ආරම්භයේදීම සාර්ථක වූ බව මේ අනුව සිතිය හැකිය.

මෙයට අතිරේක වශයෙන් 1916-1920 කාලය තුළ ඔහු දිනමිණට සැපයූ ලිපි මගින් සමකාලීන බටහිර ලෝකයේ කීර්තියක් හිමිකරගෙන සිටි දාර්ශනිකයෙකුවූ ෆ්‍රෙඩ්රික් නිට්ෂේ, සම්භාවනීය රුසියානු සාහිත්‍යධරයෙකු වූ ලියෝ ටෝල්ස්ටෝයි වැනි පුද්ගලයන් මෙන්ම අධ්‍යාපනය, මනෝවිද්‍යාව, සෞඛ්‍ය විද්‍යාව, මානව විද්‍යාව වැනි විෂයයන් කෙරෙහිද විද්‍යාත්මක චින්තනය කෙරෙහිද සිංහල උගත් පාඨකයාගේ අවධානය යොමු කළේය. මෙය මාර්ටින් වික්‍රමසිංහ විසින් තත්කාලීන පුවත්පත් කලාවේදීන් අභිබවා පෙරට තැබූ පියවරක් ලෙස හැඳින්විය හැකිය.

**මධ්‍ය අවධිය (1920-1946)**

වර්ෂ 26 ක්වූ මෙම කාල පරිච්ඡේදය තුළ මාර්ටින් වික්‍රමසිංහ පූර්ණ කාලීන පුවත්පත් කතුවරයෙකු වශයෙන් කටයුතු කළේය. එහෙයින් මෙ කාල පරිච්ඡේදය තුළ ඔහු විසින් රචිත නිබන්ධන වලින් සෑහෙන කොටසක් ඒ පුවත්පත්වල කතෘ වාක්‍ය ලෙස පළවිය. (පෙරවදනෙහි සඳහන් කොට ඇති පරිදි එම කතෘ වාක්‍ය මෙම ග්‍රන්ථ නාමාවලියට ඇතුළත් නොවේ) 1920-46 අවධිය තුළ පහත සඳහන් කර ඇති පරිදි ඔහු පුවත්පත් 3ක කතෘවරයා වශයෙන් සේවය කර ඇත.

1920 - 1927 දිනමිණ උපකතෘ

1927 - 1930 ලක්මිණ කතෘ

1931 - 1932 සිළුමිණ කතෘ

1932 - 1946 දිනමිණ කතෘ

පුවත්පත් කතුවරයෙකු වශයෙන් ගත කළ මෙම කාල පරිච්ඡේදය තුළ ඔහු විසින් සිංහල පුවත්පත් හා වරා සඟරාවලට සපයන ලද ලිපි සංඛ්‍යාව 500 ඉක්මවයි. ඉතා පුළුල් කාර්යභාරයක් ඉටුකිරීම සඳහා ඔහු මෙම ලිපි උපයෝගී කරගත්තේය. පහත සඳහන් වන්නේ එයින් කිහිපයකි.

1. ව්‍යවහාරෝචිත බස් වහරක් ගොඩනැංවීමට කටයුතු කිරීම.
2. නව විෂය ක්ෂේත්‍රයන් කිහිපයක්ම සිංහල උගත් පාඨක පරපුරට හඳුන්විදීම.
3. තත්කාලීන දේශපාලන, සමාජ හා සංස්කෘතික ප්‍රවණතාවයන් පිළිබඳව සිංහල පමණක් උගත් පාඨක පිරිස අවදියෙන් තැබීම.
4. අනුකාරක බවින් තොර අදීන සමාජයක් ගොඩනගා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව ගැමි ප්‍රබුද්ධ පරපුර තුළ හැඟීමක් ඇති කිරීම.
5. සිංහල සාහිත්‍යයට නව ප්‍රවණතාවයන් රැසක් හඳුන්වාදීම.

සිංහල ග්‍රන්ථ කරණය සඳහා උපයෝගී කරගෙන තිබුනු සකුමුසු බස් වහර ව්‍යාවහාරෝචිත බස්

වහරක් බවට පත්කිරීම සඳහා මෙම අවධිය තුළ ඔහුගෙන් ඉතා වැදගත් සේවයක් ඉටුවිය. සුබනම්‍ය බස් වහරක් නිපදවා ගැනීමේ අවශ්‍යතාවය මේ වනවිට සිංහල ලේඛකයින් බොහෝ දෙනෙකු විසින් අවබෝධ කරගෙන තිබුනි. සිංහල භාෂාවේ දුර්වලතාවය පිළිබඳව ඩබ්ලිව්. ඒ. සිල්වා මහතා 1930 දී මෙසේ සඳහන් කර ඇත. ''රාජනීති, දේශපාලන ශාස්ත්‍ර, ශිල්ප විද්‍යාදිය පිළිබඳ ලිපි පුවත්පත් සඟරා මගින් පළ වෙන්නට වූ තැන් පටන් පුරාණ පඬුවන්ගේ මාධුර්‍යය කරණ රසායන ප්‍රකාශ මේ මගින් තැලී පොඩි වී ආ බව පෙනේ. නමුත් තවමත් භාෂාව හොඳට ඔප මට්ටම්වී නැත. ගහක තිබෙන අතුරිකිලි ආදිය නම් කිරීමට අප් භාෂාව පොහොසත්ය. නමුත් මෝටර් රථයක අවයවවලට නම් 122 ක් ඇත්තාහ. ශරීරය සම්බන්ධ මාංශපේශී ක්‍රියාචාරයට නම් 120 කුත් ඇට සැකිල්ල සම්බන්ධව නම් 90 කුත් ඇත්තාහ. එසේ වුවද අපේ භාෂාවෙන් මේ නම්වලට දිය හැක්කේ නම් ස්වල්පයක් පමණකි. මේ නයින් භාෂාවේ දුප්පත්කම් බොහෝය.''

නවකථා කරණය පිළිබඳව කරන ලද කථාවකට ඇතුළත් වුනු ඉහත සඳහන් ප්‍රකාශය භාෂා රටාව පිළිබඳව නොව විද්‍යා හා තාක්ෂණික ක්ෂේත්‍රවල තොරතුරු ඉදිරිපත් කිරීමට අවශ්‍ය සිංහල වාංමාලාවේ පටුබව හෙළිකරන්නකි.

රටේ දේශපාලන සමාජ සංවාදයට පොදු ගැමි ජනතාව සහභාගි කරවා ගැනීම හා නව දැනුම ඔවුනට සැපයීම සඳහා සුබනම්‍ය බස් වහරක් යොදා ගැනීමේ අවශ්‍යතාවය මාර්ටින් වික්‍රමසිංහයන් විසින් අවබෝධ කරගෙන තිබුනි.

සිංහල වාංමාලාව පෝෂණය කිරීම සඳහාත්, සුබනම්‍ය බස්වහරක් ලිපදවා ගැනීම සඳහාත් මාර්ටින් වික්‍රමසිංහ ගැමි වහරින් පෝෂණය වූ ව්‍යවහාර බස උපයෝගී කරගත්තේය. උගත් නූගත් කාටත් තේරුම් ගත හැකිව තිබූ මෙම බස් වහර ප්‍රාචීන උගතුන් විසින් මෙන්ම නාගරික ඉංග්‍රීසි උගතුන් විසින්ද එකසේ බැහැර කොට තිබුනි.

සිංහල භාෂාවත් එහි වාංමාලාවත් පිළිබඳව මාර්ටින් වික්‍රමසිංහයන්ගේ අදහස් ඔහුගේම ලේඛනයකින් උපුටාගත් පහත සඳහන් පාඨයෙන් පිඩුකොට දැක්විය හැකිය.

''පැරණි ග්‍රන්ථකාරයෝ පොදු සිංහල ජනයාගේ කටබස ග්‍රාම්‍ය යයි සලකා බැහැර කළහ. ඔවුන් විසින් ගද්‍ය පද්‍ය දෙකම සඳහා සකුව ගුරු තන්හි තබා ගෙන පණ්ඩිත සම්මත සිංහල ග්‍රන්ථ භාෂාවක් නිපදවන ලදී. සිංහල නාගරිකයෝ පොදු සිංහල ගැමියන් සතු හැම දෙයක් මෙන්ම ඔවුන්ගේ භාෂාවද ග්‍රාම්‍ය යයි බැහැර කළහ. මෙය, බෞද්ධ සංස්කෘතියටත් බුදු සමයටත් පටහැනි මගක් ගැනීමකි....... සිංහල ජනකායට ඔවුන්ගේම සංස්කෘතිය විසින් හික්මවන ලද එකම ජනකායක් ලෙස බැඳී ජීවත්වීමට මඟ පාදන ලද අර ස්වතන්ත්‍ර චින්තනය යලිත් යට ගියේ ප්‍රතිකාලුන් ගේ පැමිණීම නිසාය. භාෂාව, සංස්කෘතිය හා ඇඳුම් පැලඳුම් ද විසින් උගතුන් හා පොදු ජනයාද බෙදනු ලැබීම ජාතියකගේ එකමිතියට මහාම බාධාවකි. පොදු ජන බස සකස් කොට වහරට ගනු ලැබීම ජාතික සමගිය ඇති කළ හැකි එක් උපායකි. උගත් නූගත් සියලු දෙනාටම කියවිය හැකි උසස් ගද්‍ය සාහිත්‍යයක් ඒ පොදු බසින් නිපදවනු ලැබීම ජනතාවක් එක්කොට බැඳීමට උචිත තවත් උපායකි.'' *

සරල සුගම බස්වහරක් සිය ලේඛන සඳහා යොදාගැනීම මගින් මාර්ටින් වික්‍රමසිංහ සමකාලීන අන් ලේඛකයින්ට හා පුවත්පත් කලාවේදීන්ට මූලාදර්ශයක් සැපයූ අතර පශ්චාත් ලේඛකයින්ට සිය දස්කම් පෑම සඳහා ප්‍රබල මෙවලමක් සැපයීය.

ළමයින් සඳහා ග්‍රාමීය විද්‍යා පොතක් හා සත්ව විද්‍යා පොත් පෙළක් 1931 වර්ෂයේදී ඔහු රචනා කළේ තමන් නිපදවූ මෙම බස්වහර උපයෝගී කරගෙනය.

තත්කාලීන සමාජ දේශපාලන සංවාදයට ක්‍රියාත්මකව සහභාගි වීම මෙන්ම ජාතික ප්‍රගතියට තුඩු දෙන අයුරින් එම සංවාදය මෙහෙයවීමට ද ඔහු මෙම අවධියේදී කැපී පෙනෙන ප්‍රයත්නයක් දැරූ බව පෙනේ. 1920-27 කාල පරිච්ඡේදය තුළදී දිනමිණ පුවත්පතටත් ස්වදේශ මිත්‍රයා පුවත්පතටත් සිංහල වාර සඟරා වලටත් ඔහු ලිපි සපයා ඇත. සිංහල වාර සඟරාවලට ඔහු ලිපි සැපයීම ආරම්භ කළේ 1921 වර්ෂයේදීය.

---

* සිංහල සාහිත්‍යය එදා සහ අද / චන්ද්‍රසිරි සෙනෙවිරත්න (සංස්) කොළඹ : ප්‍රදීප ප්‍රකාශකයෝ, 1972 - පි. 6-7

මෙම ලේඛන මගින් තත්කාලීන ප්‍රශ්න රාශියක්ම පාඨකයන් ඉදිරියේ තැබීමටත් ඒවා සාකච්ඡාවට භාජනය කිරීමටත් ඔහු සමත්විය. මෙම ලිපි මගින් සිංහල පමණක් උගත් ගැමි ප්‍රබුද්ධ පරපුර තත්කාලීන දේශපාලන සමාජ සංවාදයට හවුල් කරගැනීමට ඔහු සාර්ථක ප්‍රයත්න දැරීය. ඒ අතරම සිංහල පුවත්පත් කියවීමට පුරුදුවූ ගැමි පාඨක සංඛ්‍යාව පුළුල් කිරීම සඳහා ඔහු විසින් ඉටුකරන ලද්දේ වැදගත් මෙහෙයකි.

රටේ ප්‍රබුද්ධ පරපුර ඇමතීම සඳහා ඔහු උපයෝගී කරගත් ක්‍රියාමාර්ගයන් අතර කැපී පෙනෙන්නක් වූයේ රටේ විෂයයන් පිළිබඳව සාකච්ඡා කිරීමට පාඨකයින් මෙහෙයවීමය. මේ කාර්යය සඳහා ඔහු මතභේදවලට තුඩුදුන් නව විෂයයන් හිතාමතාම තම ලිපිවලට විෂය කරගත් බව පෙනේ.

1918 - 31 කාලය තුල ඔහු විසින් පුවත්පත් වලට සපයන ලද මෙබඳු ලිපි කිහිපයක් පහත දැක්වේ.

1. බණ අසන විට ඇතැම් අය නිදා වැටෙන්නේ මන්ද?

2. ඇහැළපොල නිලමේ වීරවරයෙක්ද?

3. කැලණිතිස්ස රජතුමා අපරාධකාරයෙක්ද?

4. ජිනරාජදාස මහතාගේ කථාව (පරම විඥානාර්ථ වාදය)

5. පූර්ව දේශීය අධ්‍යාපනය.

6. ස්වරාජ්‍යය කියන්නේ කුමක්ද?

7. සංසාරයේ අක්මුල් නැතැයි කීම බොරුවකි.

මෙම ලිපිවලට පිළිතුරු වශයෙන් හා ඒ ලිපි විවේචනය කරමින් එදිනෙදා පුවත්පත්වල පළවූ ලිපි පරීක්ෂා කළහොත් පෙනීයන්නේ ගැමි ප්‍රබුද්ධ පරපුර ඇමතීමට මාර්ටින් වික්‍රමසිංහ දැරූ ප්‍රයත්නය බොහෝ දුරට සාර්ථක වී ඇති බවය. මේ මගින් නව විෂයයන් රැසක් පිළිබඳව සිංහල පාඨකයින්ට අවබෝධයක් ලබාදීමටත් ඔවුන්ට නව සාධනාවන් රැසක් සැපයීමටත් මාර්ටින් වික්‍රමසිංහ සමත්විය. තවද, මෙහි අතුරු ප්‍රතිඵලයක් වූයේ ප්‍රබුද්ධ සිංහල පාඨක පිරිසක් මාර්ටින් වික්‍රමසිංහයන් විසින් හෙළිකරන ලද මගට පිවිසීමය.

බටහිරින් ආ සියලුම දේ බැහැර කළ යුතුය යන ජාතිවාදී පටු සංකල්පයෙන් ගැමි ජනතාව ඈත් කිරීමට කටයුතු කළවුන් අතරින් මාර්ටින් වික්‍රමසිංහ පුරෝගාමියෙකු වූයේ මේ නිසාය. දේශීය සිරිත් විරිත් ආචාරධර්ම, ඇදහිලි විශ්වාස හා සාරධර්මයන් සාධාරන විවේචනයට ලක්කිරීමටත් බටහිර දියුණු දැනුමෙහි හා සංස්කෘතික අංගයන්ගේ ආභාෂය ලබාගැනීමේ වැදගත්කම හෙළි කිරීමටත් ඔහු පුවත්පත් කලාව උපයෝගී කර ගත්තේය.

සිංහල සාහිත්‍යයට නවාංග කිහිපයක් හඳුන්වා දීමටත්, එහි නව ප්‍රවණතාවන් රැසක්ම ඇති කිරීමටත් මාර්ටින් වික්‍රමසිංහ පුවත්පත් කලාව උපයෝගී කර ගත්තේය. ඔහු හඳුන්වා දුන් නවාංගයන් අතුරින් වඩාත්ම ප්‍රකටව පෙනෙන අංගය නම් සිංහල කෙටිකථා සාහිත්‍යයයි. විසිවන සියවස වන විට බටහිර සාහිත්‍යයේ මැනවින් ප්‍රතිෂ්ඨාපනය වී තිබුනු, ජනප්‍රිය අංගයක් වූ කෙටිකථාව සිංහල පාඨකයා හමුවට පැමිණියේ පුවත්පත් මාධ්‍යය තුළිනි. විසිවන සියවස ආරම්භයටත් පෙර සිටම සිංහල පුවත්පත් රාශියකම කුඩා කථාන්තර පළකිරීම ආරම්භ කර තිබුනි. කෙටි ප්‍රබන්ධ කථා මෙන්ම පංචතන්ත්‍රය, අරාබි නිසොල්ලාසය වැනි කෘතීන්ගෙන් උපුටාගත් කථාද, බටහිර සාහිත්‍යයෙන් උපුටාගත් කථාද මුල් අවධියේ පුවත්පත්වල පළවූ කථාන්තර අතර විය. බෞද්ධ පුවත්පත්වලට වැඩි වශයෙන්ම ඇතුළත්වී තිබුනේ බෞද්ධ සාහිත්‍ය කෘතීන්ගෙන් උපුටාගත් කථාය. සිංහල බෞද්ධයා වැනි බෞද්ධ පුවත්පත්වල බෞද්ධ කථාන්තර පළවූ අතර ක්‍රිස්තියානි පුවත්පත්වල මුල් තැන හිමිවී තිබුනේ ක්‍රිස්තියානි ආගමික කථාන්තර වලටය. සෑම පුවත්පතක්ම පාහේ මෙසේ කථාන්තර පළකිරීමට පෙළඹීමෙන් පෙනී යන්නේ කථාන්තර කියවීම සිංහල පාඨකයින් අතර ජනප්‍රිය වී තිබූ බවය. තවද, මෙම සෑම කථාන්තරයකම පාහේ මුඛ්‍ය පරමාර්ථය වී තිබුනේ ධර්මෝපදේශයක් සැපයීම හෝ හුදු නොගැඹුරු විනෝදාස්වාදය සැපයීම විය. තත්කාලීන ලේඛකයෙකු වූ පියදාස සිරිසේන මහතා නව ප්‍රබන්ධ කථාවල මුඛ්‍ය පරමාර්ථය වන්නේ

ධර්මෝපදේශයක් සැපයීම බව සිය කෘතින් කිහිපයක්ම ආරම්භයේදී අවධාරණයෙන් සඳහන් කොට ඇත. තමන් විසින් රචිත ප්‍රබන්ධ කථා පාඨකයින් අතර ජනප්‍රිය කිරීමේ පරමාර්ථයෙන් කරන ලද මෙම ප්‍රකාශය ප්‍රබන්ධ කථා පිළිබඳව පාඨකයින් තුළවූ ආකල්පය හෙළි කරන පාපොච්චාරණයක් වැනිය. නවකථා සම්බන්ධයෙන් කරන ලද මෙම පාපොච්චාරණය කෙටිකථාවලට ද පොදු එකක් වූ බවට සැකයක් නැත.

විනෝදාස්වාදය සැපයීම පරමාර්ථ කොට ගෙන රචිත කථා ගැමි ජනතාව අතර එතරම් ජනප්‍රිය නොවූ බව සිතන්නට අනුබල දෙන සාධක කිහිපයක්ම තත්කාලීන සාහිත්‍යය ගවේශනය කිරීමෙන් සපයාගත හැකිය. ඩබ්ලිව්. ඒ. සිල්වා මහතාගේ ''දෙයියන්නේ රටේ'' නම් කෘතියෙහි එන කෙටිකථාවකට බීජවී ඇති කථාවස්තුවක්ද කථාන්තර පිළිබඳව තත්කාලීන පාඨක ආකල්පය අතිශයෝක්තියෙන් හෙළි කරන්නකැයි මම සිතමි. මෙම නව පන්නයේ කථාන්තර පොත් තම දරුවන් අතට පත් නොකළ යුතු ඒවා ලෙස ගැමියන් සැලකූ ආකාරය එම කෙටිකථාවෙන් හෙළි වෙයි.

බටහිර සාහිත්‍යයේ ඉතා දියුණු අඩියක පැවති මෙම සාහිත්‍ය අංගය එතරම් අවධානය යොමුකළ යුතු අංගයක් ලෙස තත්කාලීන සිංහල ලේඛකයින් විසින් පවා සළකන ලද බවත් නොපෙනේ. සන්ත්‍රාසය උපදවන අද්භූත සිද්ධීන් ආදිය ඉදිරිපත් කිරීමට වඩා ගැඹුරු කාර්යයක් මුල් යුගයේ ලියවුනු කෙටිකථා වලින් ඉටු නොවීය. මාර්ටින් වික්‍රමසිංහ කෙටිකථා රචනයට බැස්සේ මෙබඳු අවධියකදීය. දල විනෝදාස්වාදය ලබාදීමේ පරමාර්ථයෙන් තොරව යථාර්ථවාදී අන්දමින් සමාජය නිරූපනය කිරීම මගින් ගැඹුරු වින්දනයක් පාඨකයාට ලබාදීමට සමත්වූ කලාත්මක කෙටිකථා ප්‍රථම වරට සිංහල පාඨක ලෝකයා හමුවට ගෙන එන ලද්දේ මාර්ටින් වික්‍රමසිංහයන් විසිනි. මෙය ලාංකිකයන් අතින් පරිපාකයට පත් පැරණි සාහිත්‍ය සම්ප්‍රදායකට යළි ජීවය පිඹීමක් ලෙස ද සැළකිය හැකිය. දල විනෝදාස්වාදය ලබාදීමේ පරමාර්ථයෙන් මුල් යුගයේ පුවත්පත්වල පළවූ කථාන්තර මගින් නූතන කෙටිකථාව සිංහල පාඨකයාට හඳුන්වාදීම සඳහා පසුබිම සකස්වී තිබිණි. බෞද්ධ මානව දයාව පදනම්කොට ගත්තාවූත් මානව චරියාවන් යථාර්ථයෙන් විවරණය කළාවූත් කථාන්තර රාශියක්ම ජාතක කථා සාහිත්‍යයට ඇතුළත් වේ. ජන ජීවිතය අව්‍යාජ අයුරින් විවරණය කරමින් රචිත මෙම කථා සම්ප්‍රදාය බටහිර සංස්කෘතික ආක්‍රමණයන්ගේත්, දේශීය අනුකාරක ප්‍රබුද්ධයන්ගේත් බලපෑම් නිසා සම්පූර්ණයෙන්ම යටපත්වී තිබිනි. මෙසේ අභාවයට ගොස් තිබුනු එම කථා සම්ප්‍රදාය බටහිර කෙටිකථා සම්ප්‍රදාය අනුසාරයෙන් යළි පණ ගන්වා ජන ජීවිතයේ අංගයක් බවට පත්කිරීමට පුරෝගාමී වූයේ මාර්ටින් වික්‍රමසිංහයි. රුසියානු සම්භාව්‍ය කෙටිකථා සම්ප්‍රදාය ප්‍රමුඛ බටහිර කෙටිකථා සම්ප්‍රදායේද, මානව දයාව පදනම්කොට ගත් බෞද්ධ සාහිත්‍යයේද ආභාසය මේ සඳහා ඔහු නොඅඩුව ලබාගත්තේය.

1924 අප්‍රියෙල් මාසයේදී ඔහුගේ ප්‍රථම කෙටිකථාව වූ 'අභිරහස' දිනමිණ පුවත්පතේ පළවිය. මේ අවධිය වන විට 'කෙටිකථා' යන නාමය පවා සිංහල වාං මාලාවට ආගන්තුක දෙයක් වූ බව පෙනේ. මේ අවධියේ පුවත්පත් විසින් මෙම නව සාහිත්‍ය අංගය හඳුන්වන ලද්දේ 'කථාන්තරය' 'නව කථාව' හෝ 'නව ප්‍රබන්ධය' යන නම්වලිනි. 1924 වර්ෂයේ පළවූ ඔහුගේ ප්‍රථම කෙටිකථා සංග්‍රහය වූ 'ගැහැණියක්' කලාත්මක කෙටිකථා එකතුවක් වූවා පමණක් නොව, ජන ජීවිතය යථාර්ථවාදීව නිරූපනය කළ සාහිත්‍ය අංගයක් සිංහල පාඨකයාට හඳුන්වා දීමක් ද විය.

සිංහල සාහිත්‍යයේ නව ප්‍රවණතාවයක් ඇති කළ මෙම සාහිත්‍යාංගය සිංහල පාඨකයන් අතර ජනප්‍රිය වූයේ එය හඳුන්වාදී සැහෙන කලකට පසුවය. 'ගැහැණියක්' කෙටිකථා සංග්‍රහය විකිණී අවසාන වීමට වර්ෂ 12 ක් පමණ ගතවූ බව කතුවරයා සිය 'උපන්දා සිට' ග්‍රන්ථයෙහි සඳහන් කර ඇත. පුවත්පත් සාකච්ඡාවකදී මේ පිළිබඳව විමසන ලදුව මාර්ටින් වික්‍රමසිංහ විසින් මෙසේ අදහස් දක්වා තිබුණි. ''ලංකාවේ උගත් හා ප්‍රබුද්ධ පිරිස බටහිර අධ්‍යාපනය ලැබූ, බටහිර සංස්කෘතියට අනුව හැඩගැසුනු අයවූහ. මනෝ මූලික රචනයක් නිර්මාණය කළ බටහිර කතුවරුන් අගය කළ මෙම පිරිස තාත්වික සම්ප්‍රදායට හුරු අය නොවූහ. සිංහල භාෂාව විෂයයක් ලෙස ද්විතියික පාසැල්වල හා විද්‍යාලවල විෂය නිර්දේශවලට ඇතුළත්වූයේද මෙම ග්‍රන්ථය පළවී දස වසරකට (1934) පසුය.

සිංහල සාහිත්‍යයට නූතන කලාත්මක කෙටිකථාව හඳුන්වාදීමට පමණක් නොව මෙම නව සාහිත්‍යාංගයට ප්‍රතිචාර දක්වූ පාඨක පිරිසක් බිහි කිරීමට කටයුතු කිරීමට ද මාර්ටින් වික්‍රමසිංහයන්ට සිදුවිය. 1924-1946 කාල පරිච්ඡේදය තුළදී කෙටිකථාව සිංහල පාඨකයින් අතර සීඝ්‍රයෙන් ජනප්‍රියත්වයට

පත්වීමට ඔහුගේ මෙම ප්‍රයත්නයද ප්‍රබල හේතුවක් විය.

1924-46 කාලය තුළ මාර්ටින් වික්‍රමසිංහයන් විසින් සිංහල පුවත්පත්වල පළකරන ලද කෙටිකථා සංඛ්‍යාව 60 ක් වෙයි. මෙයට අතිරේක වශයෙන් ඔහු විසින් පළකොට ඇති කෙටිකථා සංග්‍රහයන් හතෙන් පහක්ම පළකොට ඇත්තේ මෙම කාල පරිච්ඡේදය තුළදීය. පහත දක්වෙන සටහන ඔහුගේ කෙටිකථා සිංහල පාඨකයින් අතර ජනප්‍රිය වූ ආකාරය දක්වන දළ සටහනක් ලෙසද යොදා ගතහැකි වෙයි.

| කෙටිකථා එකතුවේ නම | පළවූ වර්ෂය | 1924-46 කාලය තුළ පළවූ මුද්‍රණ |
|---|---|---|
| ගැහැණියක් | 1924 (2) | 1934 |
| මගුල් ගෙදර හා චරිතාදර්ශ කථා | 1927 | |
| පව්කාරයාට ගල් ගැසීම | 1936 | (2) 1942 |
| | | (3) 1944 |
| | | (4) 1945 |
| බිල්ල සහ අපූරු මුහුණ | 1945 | |
| හඳ සාක්කි කීම | 1946 | |

නවකථාව පිළිබඳව තත්කාලීන සිංහල පාඨක සමාජයේ මෙන්ම ලේඛක පරපුරේද ආකල්ප සකස් කිරීම පිණිස මාර්ටින් වික්‍රමසිංහ මෙම අවධිය තුළදී පුවත්පත් කලාව සාර්ථක මාධ්‍යයක් ලෙස උපයෝගී කොට ගත්තේය. එ සයිමන් සිල්වා, පියදාස සිරිසේන, ඩබ්ලිව්. ඒ. සිල්වා ආදීන්ගේ ප්‍රයත්නයන්හි ප්‍රතිඵල වශයෙන් සිංහල නවකථාව විසිවන සියවසේ මුල් භාගය වනවිට නාගරික හා ගැමි මධ්‍යම පන්තිකයන් අතරටද ව්‍යාප්ත වී තිබිනි. ආකෘතිය විසින් මෙන්ම වස්තු විෂය විසින්ද වික්ටෝරියානු ප්‍රේමාලාප සාහිත්‍යයේ ආභාසය ලැබූ මෙම නවකථාවල මුඛ්‍ය පරමාර්ථ වූයේ ධර්මෝපදේශ සැපයීම හෝ දළ විනෝදාස්වාදය සැපයීම විය. නවකථා කුඩාවුන් අතට පත් නොකළයුතු, වැඩිහිටියන්ට පමණක් සීමාකළ යුතු නිසරු කෘතීන් ලෙස සැලකීමට මේ අවධියේ ගැමි ජනතාව පෙළඹෙන්නට ඇත්තේද මේ හේතුව නිසා විය යුතුය. ගැමි පරපුර තුළ වූ මෙම ආකල්ප සිංහල නවකථාවේ වර්ධනයට මහත් බාධාවක් විය.

නවකථාව ගැමි පොදු ජනතාව අතර ප්‍රචලිත නොවූයේ කුමක් නිසාද? ප්‍රථමයෙන්ම තත්කාලීන නවකථා වලට වස්තු වූයේ ගැමි ජනතාවගේ ජීවිතයට ආගන්තුකවූ ගැමි සංස්කෘතිය විසින් නොවැදගත් හා අසභ්‍ය ලෙස සැලකුනු වෘත්තාන්තය. මෙකල නවකථා රචනය සඳහා යොදාගෙන් තිබුනු බස් වහරද ව්‍යවහාරික බසින් ඈත්වූ සකු මුසු බස්වහරකි. මෙම බස්වහර හා වාංමාලාව ගැමි පොදු ජනතාවට පහසුවෙන් තේරුම් ගතහැකි එකක් නොවීය.

පුස්තකාල පහසුකම් ඉංග්‍රීසි උගත් නාගරික ඉහළ මධ්‍යම පන්තියට පමණක් සීමාවී තිබූ මෙම අවධියේ පොදු ජනතාවට පොත් කියවීමට පහසුකම් නොවීය. නවකථා පොතක් මිළදී ගැනීමට තරම් මුදලක් වැය කිරීම සාමාන්‍ය ගැමි ජනතාවට දුෂ්කර විය. මෙම අවධියේ නවකථාවක මිළ දළ වශයෙන් ශත 50 ත් රු. 1.50 ත් අතර විය. මෙබඳු විවිධ හේතුන් නිසා සාමාන්‍ය ගැමි ජනතාව බණපොත්, කව්පොත් හෝ කවිකොල කියවීමෙන් තෘප්තිමත් වූහ. කව්පොත් වස්තු විෂය හා ශෛලීය අතින් මෙන්ම මිලෙන් ද ඔවුනට ගැලපුනි. කව්පොතක් හෝ කෙලයක් සඳහා ඔවුනට වැයවූයේ ශත 2 ත් 5 ත් අතර මුදලකි.

සිංහල නවකථාව කලාත්මක සාහිත්‍යාංගයක් බවට පත්කිරීම මෙන්ම එය උගත් ගැමි ජනතාවට හඳුන්වාදීමටද කටයුතු කිරීමට මාර්ටින් වික්‍රමසිංහයන්ට සිදුවූයේ මෙබඳු පසුබිමක් මතය. මේ සඳහා මූලික පියවරක් වශයෙන් නවකථා විචාරය සඳහාත් විදේශීය සම්භාව්‍ය නවකථා කරුවන් හඳුන්වාදීම සඳහාත් ඔහු පුවත්පත් කලාව උපයෝගී කරගත්තේය. නවකථා අගය කළ උගත් පාඨක පිරිසක් බිහි කිරීමටත් ලේඛක පරපුරේ ආකල්ප හැඩ ගැස්වීමටත් මෙම පුවත්පත් ලිපි මගින් ඔහු ප්‍රයත්න දැරීය.

මෙතෙක් කලක් ප්‍රාචීන උගතුන් විසින් ග්‍රාම්‍යයයි බැහැර කොට තිබූ පැරණි සිංහල සාහිත්‍ය කෘතීන් මෙන්ම රුසියානු සාහිත්‍යය ද ඇතුළු බටහිර සාහිත්‍යයන්ගෙන් ද අදීන නවකථා කලාවක් ගොඩනැගීම සඳහා ආභාෂය ලබාගතහැකි ආකාරය ඔහු හෙළි කළේය. සම්භාව්‍ය රුසියානු සාහිත්‍යකරුවන් වූ ගෝර්කි, ටෝල්ස්ටෝයි ආදීන් ප්‍රථම වරට සිංහල පාඨක ලෝකයට හඳුන්වා දුන්නේද ඔහුය. 1918 දී ලියෝ ටෝල්ස්ටෝයි පිළිබඳ දිනමිණ පුවත්පතට ලිපි පෙලක් සැපයූ ඔහු 1930 දී නවකථා කරණය පිළිබඳ ස්වදේශමිත්‍රයා පුවත්පතට සැපයූ ලිපියකින් ගෝර්කි පිළිබඳව තොරතුරු රැසක් ඉදිරිපත් කළේය. මුල් අවධියේ දී බටහිර කථා කලාව කෙරෙහි දැඩි අවධානයක් හෙළු මාර්ටින් වික්‍රමසිංහ නවකථාවේ ආකෘතික ලක්ෂණ සම්බන්ධයෙන් බටහිර කථා කලාවේ ආභාෂය නොමඳව ලබාගත් බව පෙනේ. 1930 දී ස්වදේශමිත්‍රයා පුවත්පතේ පළවූ නවකථා කතුවර ඩබ්ලිව්. ඒ. සිල්වා මහතා සමග කරන ලද විවාදය මේ බව පැහැදිලි කිරීම සඳහා නිදසුනක් වශයෙන් දැක්විය හැකිය. පාඨකයාට ගැඹුරු වින්දනයක් ලබාදිය හැකි පරිදි කලාත්මක අයුරින් සිංහල නවකථාව ගොඩනැගිය හැක්කේ බටහිර කථා කලාවේත් දේශීය කථා කලාවේත් සංකලනයෙන් නිපදවූ අදීන කථා කලාවකින් බව ඔහුගේ චින්තනය වීය.

බටහිර සාහිත්‍යයේ ජනප්‍රිය අංගයක්ව තිබුනු සිනා කථා සිංහල පාඨකයන්ට හඳුන්වා දීමටද ඔහු කටයුතු කළේය. ඔහු 1929-30 වර්ෂවල සිනාකථා කිහිපයක් දිනමිණ පුවත්පතේ පළ කළේය.

සිංහල සාහිත්‍ය විචාරය පිළිබඳව නව ප්‍රවණතාවයන් රැසක්ම ඇති කිරීමටද මාර්ටින් වික්‍රමසිංහ පුවත්පත ප්‍රබල මාධ්‍යයක් කොට ගත්තේය.

පුවත් පත් කලාවේදියෙකු වශයෙන් පූර්ණ කාලීනව සේවය කළද මෙම අවධියේ මාර්ටින් වික්‍රමසිංහ වඩාත් ප්‍රකට වූයේ ලේඛකයෙකු හැටියටය. 1920-46 කාලය තුළදී එහු විසින් රචිත ග්‍රන්ථ සංඛ්‍යාව 37 කි. නවකථා - (8), කෙටිකථා එකතු - (5), සාහිත්‍ය විචාර - (5), විද්‍යා - (6) වැනි විෂයයන් මෙන්ම පාසැල් ශිෂ්‍යයින් සඳහා පන්ති පොත් - (6) හා ළමා සාහිත්‍ය කෘතීන් - (4) වලින් ද මෙම සංඛ්‍යාව සමන්විත වෙයි.

ඔහුගේ දෙවන නවකථාව වූ සෝමා 1920 දී පළවූ අතර අයිරාංගනී 1921 දී ද, සීතා 1923 දී ද, මිරිඟුව 1925 දීද පළවිය. ඔහු නවකථා කරුවෙකු වශයෙන් සිංහල පාඨකයින් අතර ජනප්‍රිය වූ බවට මෙය සාධකයි. නවකථා කරණය පිළිබඳව ඔහු විසින් කරන ලද අත්හදා බැලීම්වල අග්‍රඵලය ලෙස 1944 දී පළවූ 'ගම්පෙරළිය' සැලකේ. මෙම කෘතිය සිංහල නවකථා ඉතිහාසයේ නව යුගයක ආරම්භය ලකුණු කරන්නක් බව බොහෝ විචාරකයෝ සළකති.

සිංහල ළමා නිර්මාණ සාහිත්‍යයේ ගොඩනැගීම සඳහා වෙහෙසුනවුන් අතුරින් මාර්ටින් වික්‍රමසිංහ පුරෝගාමියෙකු වෙයි. 1932 වර්ෂයේදී ළමා කථා පොත් තුනක් ඔහු විසින් පළකර ලදී. 'ඥානෝදය කථා' නමින් පළවුනු මෙම කථා තුනෙන් දෙකක් බටහිර සාහිත්‍ය කෘතීන්ගේ සංක්ෂිප්ත අනුවාද වූ අතර තෙවැන්න ජනකතාවක් විය.

මෙම කථාවලට අතිරේක වශයෙන් පාසැල් ශිෂ්‍යයන්ගේ ප්‍රයෝජනය සඳහා ඔහු විසින් අතිරේක කියවීම් පොත් රාශියක් පළකර ඇත. 1930 වන විට ස්වභාෂා පාඨශාලාවල විෂය මාලාවට නව විෂය කිහිපයක්ම එකතුවී තිබුණි. මෙම නව විෂයයන් ඉගැන්වීම සඳහා අවශ්‍ය වූ පාඨ ග්‍රන්ථ සකස් කළවුන් අතුරින් මාර්ටින් වික්‍රමසිංහ ද එක් අයෙකු විය. කෙසේ වුවද ළමයින් සඳහා ඔහු අතින් වූ වැදගත්ම මෙහෙය ඉටු වූයේ විද්‍යා විෂයයන් අලලා ඔහු ලියූ අතිරේක පොත්පෙළ මගින් යයි මම සිතමි.

ජීව විද්‍යාව පිළිබඳව ශිෂ්‍යයන් තුළ කුතුහලය ඇවිස්සීමට ඔහු සිය විද්‍යා විනෝද කථා පොත්පෙළ මගින් දැරූ ප්‍රයත්නය සාර්ථක වූ බව එම පොත් කිහිප වරක්ම මුද්‍රණය කර තිබීමෙන් පෙනේ. විද්‍යා විෂයයන් පිළිබඳව මාර්ටින් වික්‍රමසිංහ සිංහලෙන් ලිවීම ආරම්භ කළේ 1914 දී පමණය. පරිණාම ධර්මය භූතෝන්මාදය වැනි ඒ අවධියේ පළ කළ ලිපි වැඩිහිටි ජනතාව සඳහා ලියූ ඒවා විය. ප්‍රාථමික පන්තිවල අධ්‍යාපනය ලැබූ ළමා පාඨකයින්ට සත්ව විද්‍යා විෂයය හඳුන්වා දීමට ඔහු ග්‍රන්ථ රචනා කළේ 1931 දීය. 1934 දී පළවූ සත්ව සන්තතිය හා 1936 දී පළවූ සත්ව ලෝකයද ජීව විද්‍යාව ඉගැන්වීමේ වැදගත් පියවර වෙයි. නව විෂයයන් පිළිබඳව අදහස් පළකිරීමට සිංහල වාංමාලාව සකස් කරගත හැකි ආකාරය පිළිබඳව ඔහු විසින් පළකළ මූලාදර්ශ ලෙස මෙම ග්‍රන්ථ හැඳින්විය හැකිය.

මෙම අවධිය ඇතුළතදී මාර්ටින් වික්‍රමසිංහයන් අතින් බිහිවූ සෑම ලේඛනයක්ම එක් මූලික චින්තනයකින් පැන නැගි ඒවා ලෙස සැලකීම නිවැරදිය. මෙම මූලික චින්තනය සිංහල සංස්කෘතිය පිළිබඳව කරන ලද දීර්ඝ කාලීන අධ්‍යයනයක ප්‍රතිඵල වශයෙන් බිහිවූවක් විය. තම සමකාලීනයන් සිංහල සංස්කෘතිකාංග සොයා ඉතිහාස කථා පුවත් පරීක්ෂා කළ කාලයක ඔහු ඒ සඳහා සංස්කෘතික මානව විද්‍යාව උපයෝගී කරගත්තේය.

සිංහල සිරිත් විරිත්, කලා ශිල්ප ආදිය මෙන්ම භාෂාව හා සාහිත්‍යය පිළිබඳව ඔහු දැක්වූ උනන්දුව මෙම අධ්‍යයනය පාදක කොට ගත්තක් විය. ජාතියක සංස්කෘතිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම පිණිස එහි සාහිත්‍ය උපයෝගී කරගත හැකි ආකාරය පරීක්ෂා කිරීමේ ප්‍රතිඵලය සිංහල සාහිත්‍ය ඉතිහාසයේ පමණක් නොව විචාර කලාවේද පෙරට තැබූ විප්ලවකාරී පියවරක් විය.

ලාංකික සංස්කෘතික ප්‍රවාහය හඳුනා ගැනීමට සාහිත්‍යය උපයෝගී කරගැනීමේ ප්‍රයත්නයෙහි ප්‍රතිඵලය වූයේ සාහිත්‍ය විචාරය සඳහා නව මිණුම් දණ්ඩක් නිපදවා ගැනීමට ඔහුට හැකිවීමය. මෙම නව විචාරය මෙතෙක් කලක් සම්භාව්‍ය සාහිත්‍යය ලෙස සැලකුණු අනුකාරක සාහිත්‍යය බැහැර කොට බෞද්ධ මානව දයාව තේමා කොටගත් යථාර්ථවාදී සාහිත්‍යයෙහි අගය හෙළිකරවන්නක් විය.

මෙතෙක් කලක් ප්‍රාචීන උගතුන් විසින් ග්‍රාම්‍යයයි බැහැර කොට තිබූ ජාතක පොත, සද්ධර්ම රත්නාවලිය වැනි ගද්‍ය කෘතීන් හා ගුත්තිලය වැනි ජන කවි ආර ගුරු කොට ගත් පද්‍ය කාව්‍යයන්ගෙන් ද සිංහල සාහිත්‍ය පෝෂණය සඳහා ලබාගත හැකි ආභාසය පිළිබඳව පෙන්වාදීම නිසා තත්කාලීන විචාරකයින් ගේ දෝෂ දර්ශනයට පවා ඔහු ලක් වූ බව ''උපන්දා සිට'' ග්‍රන්ථයේ සඳහන්වෙයි.

සිංහල සාහිත්‍ය ඉතිහාසය ගවේෂණය කිරීමෙන් ඔහු ලබාගත් සාධනාවන් රැසක් මෙම අවධියේ ඔහු පළ කළ සිංහල සාහිත්‍යෝදය කථා හා සිංහල සාහිත්‍යයේ නැගීම යන කෘතීන්ට විෂය විය. මෙම කෘතීන් සිංහල සාහිත්‍ය ඉතිහාසයට නව අර්ථකථනයක් සැපයුවා පමණක් නොවේ. මාර්ටින් වික්‍රමසිංහ විසින් පසුකලක පරිපාකයට පත්කළ සාහිත්‍ය විචාර මිනුම් දඬුවල පදනම සැපයුවේද මෙම ග්‍රන්ථ යුග්මයයි. බෞද්ධ මානව හිතවාදී සංකල්පයේ ආභාසය යටතේ වැඩී ආ විරාගත දේශීය සාහිත්‍යයේ ඉතිහාසය විචාරාත්මකව අධ්‍යයනය කිරීමෙන් ලත් අවබෝධය නූතන සාහිත්‍යයේ ප්‍රගමනය සඳහා උපයෝගී කරගත යුතු ආකාරය පිළිබඳව මූලික චිත්‍රයක් සැපයීමට මෙම ග්‍රන්ථ දෙකින් ඔහු ප්‍රයත්න දරා ඇත.

සමාජ ආර්ථික මිණුම් දණ්ඩකින් සිංහල සාහිත්‍යය නිරීක්ෂණය කිරීම තත්කාලීන සිංහල සාහිත්‍ය ක්ෂේත්‍රයේ නව පියවරක් ලෙස හැඳින්විය හැකිය. මෙම පියවරෙහි ප්‍රතිඵල රාශියක්ම ඉහත සඳහන් කළ කෘතීන් දෙකට දළ වශයෙන් ඇතුළත්වී ඇත. මෙම කෘතීන් මගින් සිංහල සාහිත්‍යය කෙරෙහි කළ බලපෑම් වඩාත් පැහැදිලිව පෙනෙන්නේ මාර්ටින් වික්‍රමසිංහයන්ගේ ජීවිතයේ පශ්චාත් අවධියේ දීය.

## පශ්චාත් අවධිය (1947 - 1975)

දිනමිණ කතෘ ධූරයෙන් අස්වී පූර්ණ කාලීන ලේඛකයෙකු ලෙස කටයුතු කළ මෙම අවධිය මාර්ටින් වික්‍රමසිංහයන්ගේ ලේඛක ජීවිතයෙහි වඩාත්ම ඵලදායක යුගය ලෙස හැඳින්විය හැකිය.

ඔහු සිය ලේඛක ජීවිතයේ මුල් හා මධ්‍යම අවධි වලදී ගැමි ප්‍රබුද්ධ පරපුර කෙරෙහි කේන්ද්‍රගත අවධානයක් යොමු කෙළේය. මෙම පරපුරට අතිරේක වශයෙන් මෙම අවධිය තුළදී ඔහුගේ අවධානයට ලක්වූ තවත් පරම්පරා දෙකක් වෙයි. එනම්, 1947 නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිඵල වශයෙන් බිහිවූ ගැමි උගත් තරුණ පරපුරත්, 1956 සිට ස්වභාෂා මාධ්‍යයෙන් අධ්‍යාපනය ලද තරුණ පරපුරත්ය. මෙම අවධියේ ඔහුගේ ලේඛන කාර්‍යයෙහි කැපී පෙනෙන අංගයක් නම් මෙම පරම්පරා දෙක කෙරෙහි ඔහු විසින් කරන ලද බලපෑමයි. මෙම නව පරපුර අඥාන පිරිසක් බවට පත්කිරීමට ඔහු දැරූ ප්‍රයත්නය කෙබඳු එකක් වීද යන්න පරීක්ෂා කිරීම නූතන විචාරකයින් සතු කාර්‍යයකි.

1946 න් පසු රටේ ප්‍රබුද්ධ පිරිසෙහි නායකත්වය කරා ඇදී ආ මෙම නව පරපුර ගම්බද හා නාගරික මධ්‍යම පන්තිකයන්ගේ දරුවෝ වූහ. තවද, ඔවුහු බටහිර අධ්‍යාපන ක්‍රමය මගින් හික්මවනු ලැබූ අයද වූහ.

1942 දී බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් ලංකා විශ්ව විද්‍යාලය ආරම්භ කරන ලද්දේ බ්‍රිතාන්‍ය අධ්‍යාපන ක්‍රමයේත් ආචාර ධර්ම වලත් අනුකාරකයන් වූ නිලධාරි පෙලැන්තියක් ලංකාව තුළ බිහිකිරීම පරමාර්ථ කොට ගෙනය. මෙම අධ්‍යාපන ක්‍රමයේ පදනම මිෂනාරි ව්‍යාපාර විසින් සකස්කොට තිබිණි. බ්‍රිතාන්‍ය විශ්ව විද්‍යාලයක ස්වරූපයෙන්ම පවත්වාගෙන ගිය මෙම ආයතනයෙහි අධ්‍යාපනය ලබා පිටවූවෝ නාගරික මධ්‍යම පන්තිකයන්ගේත්, ගැමි ඉහළ මධ්‍යම පන්තිකයන්ගේත් දරුවෝ වූහ. පසුව රටේ අධ්‍යාපනයේත්, පාලන තන්ත්‍රයේත් වගකිවයුතු තනතුරු වලට පත්වූ ඔවුනට දේශීය සංස්කෘතිය නොදියුණු එකක්ය යන මූලික නිගමනය අධ්‍යාපනය විසින්ම සපයා දී තිබුණි. එසේම බටහිර සංස්කෘතිය පිළිබඳව ගැඹුරු අවබෝධයක් ද ඔවුනට නොවීය. මෙහි ප්‍රතිවිපාකය වූයේ අනුකරණය මගින් පරාරෝපිත චරියා රටාවත් හිමිකරගත්, දේශීය ජන ජීවිතයටද ආගන්තුකයන් වූ අන්දමන්ද තරුණ පෙළක් බිහිවීමය.

කෘතිම ලෙස අනුකාරකයන් රැසක් බවට පත්කොට නාගරික ඉහළ මධ්‍යම පන්තිය තුළට රුවන ලද මෙම පරපුරට අයත් වූ ගැමි තරුණයන්ට දේශීය සංස්කෘතික අංගයන් හෙලා දැකීමට පුහුණු කරවනු ලැබීය. දේශීය ජන ජීවිතය හඳුනා ගැනීමට අපොහොසත්වූ මෙම පරපුරේ ඇතැම් අය අනුකාරකත්වය හා දීනත්වය විසින් කුහකයන් පිරිසක් බවට පත්කරවනු ලැබ තිබිනි.

1947 නිදහස් අධ්‍යාපනය ආරම්භ වීමෙන් පසුව ගැමි මධ්‍යම පන්තිකයන්ගේ දරුවන්ටද ඉංග්‍රීසි අධ්‍යාපනය ලැබීමේ පහසුව ලැබුණි. මෙතෙක් කලක් ඉහළ මධ්‍යම පන්ති සතු වරප්‍රසාදයන්ව පැවති උසස් අධ්‍යාපනයෙහි දොර කවුළු ගැමි තරුණ පරපුරට විවෘත වීම පශ්චාත් සමාජ ප්‍රවණතාවයන් කිහිපයක්ම කෙරෙහි බලපෑ ප්‍රබල සාධකයක් විය.

කෙසේ වුවද, අනුකාරක නිලධාරි පන්තියේ හා මිෂනාරි ව්‍යාපාරවල බලපෑම නිසා දේශීය අවශ්‍යතාවයන්ට ගැලපෙන අධ්‍යාපන ක්‍රමයක් මෙමගින් බිහි නොවූ බවට පැහැදිලි නිදසුන් රැසක්ම බෞද්ධ තොරතුරු පරීක්ෂක කොමිෂන් සභා වාර්තාවෙන් සපයා ගත හැක.

මෙම උගත් තරුණ පරපුර තුළ යටපත්ව තිබුනු දේශීය සංස්කෘතිය පිළිබඳ හැඟීම මතුකොට ඔවුන් රටේ දේශපාලන සමාජ සංවාදයට හවුල් කරවා ගැනීමේ අවශ්‍යතාවය මාර්ටින් වික්‍රමසිංහයන් විසින් වටහාගෙන කිබිනි. 1949 දී ඉංග්‍රීසි බසින් ද ලිවීම ඔහු ආරම්භ කළේ මෙම අවබෝධය විසින් මෙහෙයවනු ලැබීමෙනි. මෙම ලිපි සඳහා ඔහු විසින් තෝරාගත් මාතෘකා පරීක්ෂා කළ හොත් මේ බව වඩාත් පැහැදිලි වනු ඇත.

සිංහල භාෂාව පෝෂණය කිරීමට ඔහු සිය ලේඛක ජීවිතයේ මුල් හා මධ්‍ය භාගවලදී දැරූ ප්‍රයත්නය පශ්චාත් අවධියේදී උච්ච අවස්ථාවක් වෙත එළඹ තිබිණ. 1949 දී 'Ceylon Daily News' පුවත්පතට සැපයූ ලිපි පෙළක් මගින් සිංහල බස්වහර පණ්ඩිත ප්‍රිය ලිඛිත බසින් නොව ජන ජීවිතයෙන් පෝෂණය කරගත යුතු බවට ඔහු අවධාරණය කළේය. බමුණු බලපෑම් නිසා ප්‍රායෝගික වූද, සරල වූද, ව්‍යංජනා ශක්තියෙන් යුක්තවූද ව්‍යවහාරික බස උගතුන් අතින් යටපත්වී තිබුණු ආකාරය ඔහු මෙම ලිපි පෙළින් පෙන්වා දුන්නේය. පාරිභාෂික වචන සඳහා සකු වදන් ණයට ගන්නවුන් ඔහුගේ නිර්දය විවේචනයට හසුවිය. සකු වදන් යොදා සකස් කෙරෙන පාරිභාෂිත වචන මාලා වැඩකට නැති මෙවලම් බවට පත්වන බව ඔහු කල්තියාම පෙන්වා දුන්නේය.

උගත් තරුණ පරපුරට දේශීය භාෂාව හා සාහිත්‍යය ඇතුළු සංස්කෘතිකාංග ගැන අවබෝධයක් ලබා දීමටත්, දේශීය සංස්කෘතිය පිළිබඳව ඔවුන් තුළවූ පටු ආකල්පයන් බැහැර කොට ඔවුන් අනුකාරක බවින් මිදුනු අදීන පිරිසක් බවට පත් කිරීමටත් ඔහු සිය ලේඛන මගින් ප්‍රයත්න දැරීය. ජාතික සංස්කෘතිය හා ජන ජීවිතය දෙස ජුගුප්සාවෙන් තොරව බැලූ ප්‍රබුද්ධ පිරිසක් බිහිකිරීමට ඔහු ගත් ප්‍රයත්නය කෙතෙක් දුරට සාර්ථකවීද යන්න පිළිබඳ ප්‍රමාණවත් ඇගයුමක් මේ දක්වා කෙරී නැත.

1956 සිංහල මාධ්‍යයෙන් උසස් අධ්‍යාපනය දීම ආරම්භ කරන ලද්දේ විප්ලවකාරී පියවරක් ලෙස නොව දීර්ඝ කාලයක් තිස්සේ වැඩෙමින් ආ සමාජ ඉල්ලුමක ප්‍රතිඵලයක් වශයෙනි. මෙම පියවර සඳහා අවශ්‍ය වූ වාං මාලාව පෝෂණය කිරීම හා බස්වහර සකස් කිරීම සඳහාද මාර්ටින් වික්‍රමසිංහයන්ගෙන් ඉටුවූ සේවය විශාලය. 1954 දී රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ විද්‍යා වචන මාලා සැකසුම් කමිටුවේ සාමාජිකයෙකු කිරීමට ඔහු මෙහෙයවන ලද බව පෙනේ.

1948 - 75 කාලය තුළ බෞද්ධ දර්ශනයේ විවිධ අංග අලලා ඔහු විසින් රචිත ග්‍රන්ථ සංඛ්‍යාව පහකි. විද්‍යාත්මක ආකල්පය තුළින් බෞද්ධ දර්ශනය විවරණය කිරීමෙන් තොරව එය අනාගත පරපුර විසින් පිළිගනු ලබන දහමක් බවට පත්කිරීමේ දුෂ්කරතාවය අවබෝධ කර ගැනීම මෙම අධ්‍යයනය සඳහා ඔහු මෙහෙය වන්නට ඇත. බෞද්ධ සමාජ සාර ධර්මයන් මත ගොඩනැගුනු සිංහල සමාජය ගැන අවබෝධයක් ලද හැක්කේ බෞද්ධ දර්ශනයත්, එමගින් පිළිබිඹු කළ සමාජ යථාර්ථයන් පිළිබඳ අවබෝධය තුළින් බව ඔහු දුටුවේය. යති සංස්කෘතියෙහි අනුකරණාත්මක අංගත්, බමුණු මතත් බැහැර කිරීමෙන් තොරව මෙම අවබෝධය ලබා ගත නොහැකි විය. මාර්ටින් වික්‍රමසිංහයන්ගේ අවසන් නවකථාව වූද, විචාරකයන් තුළ මහත් ආන්දෝලනයක් ඇති කළා වූද ''බවතරණය'' බිහිවීමට මෙම අධ්‍යයනය ඉවහල් විය.

1914 සිට 1975 දක්වා වූ දශක 6 ක් පුරා ලේඛක වෘත්තියෙහි නියැළුන් මාර්ටින් වික්‍රමසිංහයන් අතින් බිහිවූ ලේඛන සංඛ්‍යාව 1500 කට ආසන්නය. සිංහල හා ඉංග්‍රිසි දෙබසින්ම ලේඛක කාර්‍යයේ නිරතවීම නිසා වඩාත් පුළුල් පාඨක පරපුරක් කෙරෙහි බලපෑමට ඔහුට හැකිවිය. තවද, ඔහු විසින් සිංහලනේ රචිත නවකථා හා කෙටිකථා කිහිපයක්ම ඉංග්‍රිසි භාෂාවටද විදේශීය භාෂා කිහිපයකට ද පරිවර්තනය කොට ඇත.

1947 දී පළවූ ඔහුගේ 'සිංහල සාහිත්‍යයේ නැගීම' ආචාර්‍ය ඊ. ආර්. ද ඇස් සරච්චන්ද්‍ර විසින් ඉංග්‍රිසියට පරිවර්තනය කොට 'Land Marks of Sinhalaese Literature' නමින් 1948 දී පළ කරනු ලැබීය. ඔහුගේ ඉතාමත්ම ජනප්‍රිය කෘතියක් වූ 'අපේගම' ග්‍රන්ථයේ ඉංග්‍රිසි පරිවර්තනය Lay bare the roots නමින් 1968 දී පළවිය. මඩොල්දූවෙහි ඉංග්‍රිසි පරිවර්තනය 1975 දී ද, ගම්පෙරළියෙහි දෙමළ පරිවර්තනය 1964 දීද පළවිය.

ඔහුගේ කෙටිකථා හා නවකථා විදේශීය භාෂා කිහිපයකටම පරිවර්තනය වී ඇත. ඔහුගේ කෙටිකථා එකතුවක් 1961 දී චීන බසින් ද, 1968 දී රුසියන් බසින් ද පළවිය. මඩොල්දූවේ චීන පරිවර්තනය 1961 දීද රුමේනියානු පරිවර්තනය 1962 දීද, බල්ගේරියානු පරිවර්තනය 1964 දීද, රුසියානු පරිවර්තනය 1969 දීද පළවිය. 1965 දී ගම්පෙරළිය, කලියුගය හා යුගාන්තය නවකථාත්‍රයේ රුසියානු පරිවර්තනය එකම පොතක් වශයෙන් සෝවියට් රුසියාවේ පළවිය. හයමසක් තුළදී මෙම ග්‍රන්ථයේ පිටපත් ලක්ෂයකට අධික සංඛ්‍යාවක් අලෙවි වූ බව සෝවියට් ලේඛක සංගමයේ වාර්තාවකින් හෙළිවේ. විදේශයන්හි අලෙවි වූ ඔහුගේ කෘතීන් වල පිටපත් සංඛ්‍යාව පිළිබඳ නියත සංඛ්‍යා ලේඛන සපයා ගත නොහැකි වුවද විදේශීය පාඨකයන් අතර ඔහුගේ කෘතීන් ජනප්‍රිය වූ බව පැහැදිලිය.

1914 - 1975 කාලයතුළ දේශීය පාඨකයන් අතට පත්වූ මාර්ටින් වික්‍රමසිංහයන්ගේ කෘතීන් පිළිබඳව දළ අවබෝධයක් ලබා ගැනීමට පහත සඳහන් සටහන ඉවහල් වනු ඇත. 1946 දී ආචාර්‍ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින්ද 1955 දී ලාල් ප්‍රේමනාත් ද මැල් විසින්ද සංස්කරණය කොට පළකරන ලද ඔහුගේ කෙටිකථා එකතු දෙකක්ද මෙම සංඛ්‍යා ලේඛනවලට ඇතුලත්වේ.

| වර්ගය | මුද්‍රණය කරන ලද පිටපත් සංඛ්‍යාව | | |
|---|---|---|---|
| | සිංහල | දෙමළ | ඉංග්‍රිසි |
| නවකථා | 3,49,000 | 2500 | |
| ළමා සාහිත්‍ය කෘතීන් | 1,75,000 | | 2500 |
| සාහිත්‍ය විචාර ග්‍රන්ථ | 1,62,000 | | 8500 |
| කෙටිකථා එකතු | 1,32,000 | | |
| විද්‍යා, මානව විද්‍යා හා දාර්ශනික කෘති | 71,000 | | 16,000 |
| පාසැල් පොත් | 46,000 | | |
| දෘශය කාව්‍ය | 17,500 | | |
| පද්‍ය කාව්‍ය | 7,000 | | |
| වෙනත් | 26,000 | | |
| | 9,85,500 | 2500 | 27,000 |
| එකතුව | 10,15,000 | | |

ලාංකික ලේඛකයින් අතරින් වැඩිම ලේඛන ගණනක් බිහිකළ ලේඛකයා මෙන්ම වැඩි වශයෙන් විචාරයට භාජනය වූ ලේඛකයා ලෙසද මාර්ටින් වික්‍රමසිංහ හැඳින්විය හැකිය. ඔහුගේ ඇතැම් කෘතීන් විදේශීය භාෂා වලට පරිවර්තනය වීම නිසා විදේශීය විචාරකයින්ගේ අවධානය ද ඔහු වෙත යොමුවිය.

සිය ජීවිත කාලය තුළදී ඔහු විසින් රචිත ග්‍රන්ථ සංඛ්‍යාව 87 කී. මෙයින් 80 ක්ම සිංහල ග්‍රන්ථ වූ අතර 7 ක් ඉංග්‍රීසි බසින් රචිත ඒවා විය. ඔහුගේ ඉංග්‍රීසි ග්‍රන්ථ පරීක්ෂා කරන විට කැපී පෙනෙන ලක්ෂණයක් නම් ඒවා භාෂාව, සාහිත්‍යය, කලාශිල්ප හා සිංහල සංස්කෘතිය යන විෂයයන්ට සීමාවී ඇති බවය.

දේශීය විචාරක පරපුරු තුනකම විචාරයට මාර්ටින් වික්‍රමසිංහ මාතෘකා සැපයීය. විවිධ විෂයයන් අලලා ඔහු විසින් පුවත්පත් වලට සැපයූ ඇතැම් ලිපි තත්කාලීන සිංහල පාඨකයින්ගේ නිර්දය විවේචනයට හසුවිය. මෙබඳු ඇතැම් විචාර පුවත්පත් විවාද දක්වාම දික්ගැසී ගිය බව පෙනේ.

බටහිර අධ්‍යාපනයේ ප්‍රතිඵල වශයෙන් ලංකාවේ බිහිවූ ද්විභාෂා හැකියාව ලත් උගත් තරුණ පරපුර කෙරෙහි අනල්ප බලපෑමක් කිරීමට ඔහු සමත්විය. මෙම පරපුරෙන් නැඟී ආ විචාරකයින් රැසක්ම පේරාදෙණි විශ්ව විද්‍යාලයෙන් උපත ලැබූ අය වූහ. මාර්ටින් වික්‍රමසිංහගේ නවකථා, කෙටිකථා මෙන්ම ශාස්ත්‍රීය නිබන්ධන ද මෙම නව විචාරක පරපුරට සරු මූලද්‍රව්‍ය සැපයීය.

මාර්ටින් වික්‍රමසිංහගේ කෘතීන් කියවූ පාඨක පිරිස එක් රටකට හෝ එක් භාෂාවකට සීමා නොවීය. විදේශීය පාඨකයින් අතර මාර්ටින් වික්‍රමසිංහ ප්‍රචලිත වූයේ නවකථා හා කෙටිකථා රචකයෙකු වශයෙනි. දේශීය පාඨක පරපුරට ඔහු නිර්මාණ ග්‍රන්ථ රචකයෙකු මෙන්ම විචාරකයෙකුද, සමාජ චින්තකයෙකුද, අධ්‍යාපනඥයෙකුද විය. ක්‍රියාත්මක ලේඛකයෙකු වශයෙන් වර්ෂ 60 ක් ජීවත්වීම පරම්පරා කිහිපයක් දිග කාල පරිච්ඡේදයක් ජීවත්වීම වැන්න.

මාර්ටින් වික්‍රමසිංහ කාලයාගේ අවශ්‍යතාවයන් තේරුම් ගෙන සමාජය සමග ඉදිරියට ගිය ලේඛකයෙකු ලෙස විචාරකයන් හඳුන්වන්නේ මේ නිසාය. පියදාස සිරිසේන, ඩබ්ලිව්. ඒ. සිල්වා, කුමාරතුංග මුනිදාස ආදීන්ගේ සමකාලිකයෙකු වූ ඔහු වෙනස්වෙමින් පෙරට ගිය සමාජය සමග එක්ව ගමන් කිරීමට සමත්වූයේ සිංහල සංස්කෘතියත් ගැමි ජීවිතයත් පිළිබඳව ඔහු තුළ වූ පරිඥානය නිසාය. මෙමගින් සමකාලීන සමාජ අපේක්ෂාවන්ද ප්‍රවණතාවයන්ද තේරුම් ගැනීමට ඔහු සමත් විය. මෙම අවබෝධය ලබා ගැනීමට සංස්කෘතික මානව විද්‍යාව පිළිබඳව ඔහු සතුවූ දැනුම මෙන්ම විද්‍යාත්මක ආකල්පයද ඔහු උපයෝගී කොට ගත්තේය.

විෂයයන් එකිනෙකින් වෙන්කොට හැදෑරූ අධ්‍යාපන ක්‍රමයක මග පෙන්වීම නොලත් ඔහු මෙම දැනුම ලබාගත්තේ අත් දැකීමෙන් උගත් දේ සමග විවිධ විෂයයන් පිළිබඳ පතපොත තුලනාත්මකව අධ්‍යයනය කිරීම මගිනි. මේ මගින් ලබාගත් නව දැනුම ඔහු සිංහල පාඨකයා අතට පත් කළ ප්‍රධානතම මාධ්‍යය වූයේ පුවත්පත් ලිපිය.

ලාංකික උගත් තරුණ පරපුර කෙරෙහි තීව්‍ර බලපෑමක් කිරීමට ඔහුට ලැබුණු වැදගත් අවස්ථාවක් නම් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් ඔහුගේ ග්‍රන්ථ කිහිපයක්ම වරින්වර පාසැල් සිසුන්ගේ පාඨග්‍රන්ථ ලෙස යොදා ගැනීමය. 1934 දී ඔහුගේ ප්‍රථම කෙටිකථා එකතුව වූ ''ගැහැණියක්'' ග්‍රන්ථය ආනන්ද විද්‍යාලයේ ශිෂ්‍යයින් සඳහා අනිවාර්ය ග්‍රන්ථයක් ලෙස නම්කර තිබුණි. රෝහිණී, ගම්පෙරළිය, විරාගය, කරුවල ගෙදර ආදී ග්‍රන්ථ රජයේ පාසැල් සිසුන් සඳහා පාඨග්‍රන්ථ ලෙස යොදාගත් වෙනත් කෘතීන්ය. කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර, අ. පො. ස. සාමාන්‍ය පෙළ හා උසස් පාඨශාලා සහතික පත්‍ර පන්තිවල අධ්‍යාපනය ලැබූ තරුණ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට අඩු වශයෙන් ඉහතකී ග්‍රන්ථ වලින් එකක්වත් පරිශීලනය කිරීමේ අවස්ථාව ලැබී තිබුනි, මෙයට අතිරේක වශයෙන් ඔහුගේ කෘතීන් රාශියක්ම ශිෂ්‍යයින් සඳහා අතිරේක ග්‍රන්ථ වශයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අනුමත කර තිබිනි. නිර්දිෂ්ඨ ග්‍රන්ථ ලෙස නම් කර නොතිබුන ඔහුගේ සාහිත්‍යෝදය කථා හා සිංහල සාහිත්‍යයේ නැගීම යන ග්‍රන්ථ සිංහල සාහිත්‍යය හැදෑරූ අටවැනි ශ්‍රේණියේ සිට විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වා වූ හැම මට්ටමකම ශිෂ්‍යයින් විසින් අනිවාර්යයෙන්ම පරිශීලනය කළ යුතු ග්‍රන්ථ දෙකක් ලෙස පිළගෙන තිබුණි. සිංහල සාහිත්‍යයේ නැගීම 1949 දී ඉංග්‍රිසියට පරිවර්තනය කොට පළකිරීමට හේතුවූයේද මෙම අවශ්‍යතාවයය.

උගත් තරුණ පරපුරේ අවධානයට මාර්ටින් වික්‍රමසිංහ ලක්වීමට ඉහත සඳහන් කරුණ ප්‍රබල හේතුවක් වූ බවට සැකයක් නැත. ඔහුට උපහාර වශයෙන් වාර සඟරා කිහිපයක් විසින්ම විශේෂ කලාප නිකුත් කර තිබිණි. ලංකා විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධි නිබන්ධනයක් සඳහා ද ඔහුගේ කෘතීන් පිළිබඳ විචාරයක් තෝරාගන්නා ලද අතර නූතන ලේඛක පරපුරේ ඇතැම් අය මාර්ටින් වික්‍රමසිංහගේ කථා ආකෘතිය, ශෛලිය පමණක් නොව වාං මාලාවද අනුකරණය කිරීමට ප්‍රයත්න දරූ අවස්ථා බහුල විය.

ඔහුගේ හැට වසරක ලේඛක ජීවිතය පරම්පරා 4 ක් හා සංස්කෘතීන් දෙකක් එකට ඈඳන පුරුකක් ලෙස හැඳින්විය හැක. සංවර්ධනය වෙමින් පවත්නා හැම ජාතියකටම පොදු ප්‍රශ්නයක්ව තිබුනු අදීන සංස්කෘතියක් ගොඩ නගා ගැනීමේ ප්‍රශ්නයට සාර්ථකව මුහුණ පෑම පිණිස අවශ්‍යවූ තරුණ පරපුරේ බුද්ධිමය පසුබිම ගොඩනැගීමට පුරෝගාමී වූයේද මාර්ටින් වික්‍රමසිංහය.

ස්වාධීන චින්තනයට අනුබල දුන් බෞද්ධ සංස්කෘතියේ වැදගත් කමත්, අදීන සංස්කෘතියක් ගෙඩනගා ගැනීම සඳහා එය පදනම් කරගත හැකි ආකාරයත් ඔහු පෙන්වා දුන්නේය. සංස්කෘතික ප්‍රගතියට බාධාවක්ව පැවති අනුකාරකත්වය පිටුදැකීම පිණිස කළ නිරන්තර අරගලයක් ලෙස මාර්ටින් වික්‍රමසිංහයන්ගේ ලේඛක ජීවිතය හැඳින්විය හැකිය. ලංකා විශ්ව විද්‍යාලයෙන් මෙන්ම වෙනත් මතධාරී හවුල් වලින්ද උපත ලැබූ ගුරුකුලයන් ඔහු අවඥාවෙන් බැහැර කළේ නව අනුකාරක පරපුරක් බිහිකිරීම පිණිස මෙම ගුරුකුල වලින් ලැබුණු අනුබලය දැකීම නිසාය.

''අනුකරණය හා ස්වාධීනත්වය'' නමින් ඔහු 1967 දී සඟරාවකට ලියූ ලිපියක මෙසේ සඳහන් කළේය. ''අපේ විශ්ව විද්‍යාලවල සාහිත්‍ය කලා අධ්‍යාපනය අනුකාරක විප්ලව වාදීන් වන්ට වැයම් කරන තරුණයන්ට අනුබල දෙන අභ්‍යාස ක්‍රමයක් වී තිබේ. බටහිර චිත්‍ර, ප්‍රතිමා කලා, සංගීතය, සාහිත්‍යය, දේශපාලනය හා අර්ථ ක්‍රමයද පිළිබඳ විපර්යාසයන්ට මග පාදන ලද්දේ ශික්ෂණයක් නොලත් අනුකාරකයන් විසින් නොවේ. තම තමන්ගේ ශක්තීන්ට උචිත විෂයයන් අරබයා දැඩි ශික්ෂණයක් ස්වෝත්සාහයෙන් හෝ විද්‍යායතනයකින් හෝ ලැබූ ස්වාධීන උගතුන් විසිනි.''

විදේශීය විචාරකයින්ගේ මෙන්ම දේශීය විචාරකයනිගේ ද වැඩි අවධානයට ලක්වී ඇත්තේ මාර්ටින් වික්‍රමසිංහය්නගේ නවකථා හා කෙටිකථා ය.

විසිවන සියවසේ මුල් දශක දෙක තුළ ලාංකික සමාජ ආර්ථික සංවාදයේ ප්‍රබල අංගයක්ව පැවති සමාජ ශෝධන ආකල්පයට වඩාත් ගැඹුරු අරුතක් සැපයීමට ඔහුගේ මුල් නවකථා වලින් ප්‍රයත්නයක් දරා තිබුණි. මීරිගුව හා ඉන්පසුව ඔහු රචනා කළ නවකථා යථාර්ථවාදීව සමාජය නිරූපණය පිණිස ගන්නා ලද ප්‍රයත්නයක් පරිපාකයට පැමිණවීම පිණිස තබන ලද පියවර කිහිපයක් ලෙස හැඳින්විය හැකිය. ඔහුගේ ත්‍රිත්ව නවකථාව මෙම පියවර මාලාවෙහි වඩාත්ම කැපී පෙනෙයි. සම්ප්‍රදායික සමාජය බිඳවැටෙමින් පැවති අයුරුත්, ඒ මත ගොඩනැගෙමින් තිබුනු නව සමාජය බිහිවන ආකාරයත්, පිළිබඳව ප්‍රබල ආලෝචනාවන් ඔහු සතුව තිබුනු බවට මෙම නවකථාත්‍රයත් විරාගයත් සාධක සපයයි.

මාර්ටින් වික්‍රමසිංහයන්ගේ භාෂා ශෛලියත්, ඔහු උපයෝගී කොටගත් වාං මාලාවත් හැදෑරීම් නව ලේඛකයින්ටත්, සිංහල භාෂාව හා සාහිත්‍යය හදාරන ආධුනිකයින්ටත් ඉතාමත්ම ප්‍රයෝජනවත් වනු ඇත.

ඔහුගේ භාෂා ශෛලිය හා වාං මාලාව මෙන්ම කරුණු ඉදිරිපත් කරන ආකාරයද පුවත්පත් කලාවේදියෙකු වශයෙන් ඔහු ලබා තිබූ ශික්ෂණය හෙළිකරන කැඩපතක් වැන්න. තමන් විසින් රචිත ලේඛන වලට හෝ ග්‍රන්ථ වලට ආයාසයෙන් නිපදවාගත් පණ්ඩිත ප්‍රිය වචන ඔහු ඇතුලත් නොකළේය. විද්‍යා විෂයයන් ඇතුළු විවිධ විෂයයන් අලලා ඔහු රචනා කළ ග්‍රන්ථ සඳහා වුවද ඔහු පරිභාෂිත වචන යෝදා නොගත්තේය. අධෝලිපි සටහන් හෝ උධෘත පාඨයන් පවා ඔහු සිය ග්‍රන්ථ වලට ඇතුලත් කළේ ඉතා අඩුවෙනි. අහම්බෙන් තෝරාගත් ඔහුගේ ග්‍රන්ථ කිහිපයක් පරීක්ෂා කිරීමේදී හෙළිවූයේ එම ග්‍රන්ථවලට ඇතුළත්වූ අධෝලිපි වලින් 98% ක්ම යොදාගෙන තිබුනේ ආශ්‍රිත ග්‍රන්ථ සඳහා යොමු දැක්වීම පිණිස බවයි. සටහන් හෝ උධෘත පාඨ ආදිය තිබුනේ අධෝලිපි වලින් 2% ක් පමණකි. යම් ග්‍රන්ථයකින් උපුටාගත් කොටසක් ලේඛනයේ ගලායාමට බාධාවක් නොවන අයුරින් තමාගේ වචන වලින්ම ලේඛනයට

ඇතුලත් කිරීම ඔහු බහුල වශයෙන් අනුගමනය කළ රීතිය විය. මෙම තොරතුරු සපයා ගැනීම සඳහා උපයෝගී කොටගත් නියැදිය පහත දක්වේ.

| පළවූ වර්ෂය | ග්‍රන්ථය | අධොලිපි සංඛ්‍යාව |
|---|---|---|
| 1919 | ශාස්ත්‍රීය ලේඛන | 14 |
| 1941 | විචාර ලිපි | 6 |
| 1946 | සිංහල සාහිත්‍යයේ නැගීම | 13 |
| 1950 | සාහිත්‍ය කලාව | 32 |
| 1954 | නව පද්‍ය සිංහලය | නැත |
| 1962 | සිංහල සකස්කඩ | 10 |
| 1962 | සෝවියට් දේශයේ නැගීම | 157 |
| 1965 | නවකථාංග හා විරාගය | 65 |
| 1970 | සිංහල නාටකය හා සඳකිඳුරුව | 10 |
| 1974 | මානව විද්‍යාව හා සිංහල සංස්කෘතිය | 23 |

සිංහල ව්‍යවහාර බසත් ගැමි වහරත් ගුරු කොටගෙන ඔහු නිපදවාගත් වාංමාලාව මෙන්ම භාෂා රීතියද පශ්චාත් ලේඛකයින්ට මූලාදර්ශයක් විය. ගැමි වහර පිළිබඳ ඔහුගේ ආකල්පය 'සිංහල සකස්කඩ' ග්‍රන්ථයෙන් උපුටාගත් පහත සඳහන් කියුමෙන් හෙළිවේ.

''භාෂාව, සිංහලයන්ගේ ජීවිතය හා සංස්කෘතියද යන තුන සුහදයන් ලෙස එකට බැඳී තවමත් පවතින්නේ ගම්වල සිංහලයන් අතර. ඒ නිසා ඒ තුනෙහි නෑ සබඳකමත් ජීව භාෂාවක් වශයෙන් සිංහලයෙහි ව්‍යඤ්ජනා ශක්තියත් පිළිබඳ වැටහීමක් හා හැඟීමක් ලැබිය හැක්කේ ගැමි ජීවිතයත් බසත් විමසා උගැන්මෙනි''

ලංකා ඉතිහාසයේ යුග දෙකක් එකට ඈඳු පුරුකක් ලෙස කටයුතු කළ මේ මහා ලේඛකයා විසින් දශක 6 ක් තුළ ලාංකික ජනතාවගේ සමාජ සංකල්ප, සාහිත්‍ය, විචාර සිද්ධාන්ත හා සංස්කෘතික ආකල්ප කෙරෙහි කළ බලපෑම් පිළිබඳ පූර්ණ අධ්‍යයනයක් කිරීම අත්‍යවශ්‍ය කටයුත්තකි. මෙම ග්‍රන්ථ නාමාවලිය එබඳු අධ්‍යයනයකට මග හෙළි කරනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

සම්පාදක

# PREFACE

Martin Wickramasinghe has been a dominant figure in our contemporary literary scene for a long time. Through his valuable and varied contributions to our literature he made a very strong impact on our society during his 60 years of literature activity. He started his career as a free lance writer to the Dinamina and developed himself in the course of time as a journalist, a writer, a critic, a novelist and as a philosopher with deep insights into our society.

Although a lot has been written about him and his writings it cannot be said that his contribution to our society and his influence have been fully studied. Only so me aspects of his literary activity have been evaluated so far. One reason why a comprehensive and systematic study of this great scholar's work has not yet appeared may be the dearth of information on his writings' During six decades of an active literary life Martin Wickramasinghe produced nearly 2,000 pieces of writings, creative and academic, in both Sinhala and English. His subject field covers a wide range in the Humanities and the Science, though he was mainly concerned with subjects such as language, literature, religion, culture and social anthropology. Therefore an assessment of his achievements can never be comprehensive unless the researcher has access to a full bibliography of his writings.

The aim of this bibliography is to present the available information on his writings. This bibliography will also serve as a guide for those interested in such themes as the evolution of readership trends and tastes in Sri Lanka.

The compiler of a bibliography is mainly concerned with documents belonging to two categories. - (1) the writings of the author and (2) writings by others about the author's work' The present bibliography covers the information belonging to the first category. Work has also started on the documents belonging to the latter category.

Demarcation in the limits of literature search was one of the difficult problems that had to be tackled in this project. In spite of the fact that Martin Wickramasinghe was particularly concerned with Sinhala creative writing, he also made valuable contributions in various other subject fields. As a journalist, he was a pioneer who attempted to impact the knowledge of developments in Western sciences and humanities to the Sinhala reading public. His articles on subjects such as the theory of evolution published in 19 were quite new to those who did not know English. His writings include books and articles biology, social anthropology, archeology and related subjects in the context of our country. He also wrote books foe use in the secondary schools. He pioneered scientific literature for children in their mother tongue as far back as 1931. Another of his remarkable contributions was the introduction of the modern short story to the Sinhalese reading public in 1923 through local newspapers. As a result of his varied interest his writings are spread over a wide subject field making the demarcation of the literature survey more difficult and time consuming.

To add to the difficulties his writings are scattered among almost all the Sinhalese and English newspapers and periodicals published during a period of 60 years. The journals which carried his articles ranged from school magazines to academic periodicals and journals of University departments. On the one hand, it was not practicable to examine all the newspapers and journals published during such a long period of time; on the other hand, criteria could not be devised to select the specific periodicals that should be examined.

The need for a well orgnaised bibliographic and documentation service in Sri Lanka was badly felt in the preparation of this bibliography. The compilation of this bibliography would have been easier if there had been basic bibliographic resources which could have been utilised for the location of documents. The most important bibliographic source of a country is the national bibliography. Unfortunately the Sri Lanka National Bibliography has failed to keep abreast with time and there is no regular documentation service covering newspaper an periodical articles at present. Even the newspaper publishers of Sri Lanka have failed to maintain indexes of there own publications. However from 1969 the Colombo Museum Library has been publishing an index of selected periodical articles.

The two select bibliographies on Martin Wickramasinghe which were published in Navalokaya Martin Wickramasinghe felicitation number and Koggala Maha Prajnanaya respectively, were not found to be very useful since these bibliographies have covered only fraction of his contributions to local newspapers and periodicals.

This is situation which is not at all conducive to the growth of a social awareness, especially in our younger generation. In most of the developing countries we are handicapped by the lack of bibliographic control over our national publications. The Department of National Archives which acts as the repository of the national publications has not been able to obtain and preserve all our publications. This is partly due to the loopholes in the deposit laws and the lack of understanding and co-operation on the part of publishers. Some editions of Martin Wickramasinghe's books could not be traced since they had not been deposited in the National Archives. Our literature constitutes the major part of our cultural activity which will be inherited by our future generations. Hence it is our paramount duty preserve it for their use. The government should be commended for taking action to build up a national library even at this late stage.

Some of Martin Wickramasinghe's short stories and essays were translated into several languages including English, and published in newspapers and periodicals abroad. These are not included in this bibliography, as the publications were not accessible.

Out of the contributions he has made to local newspapers large number of articles were not included in this bibliography as the authorship could not be conclusively established. For example, hundreds of contributions he made in the form of editorials during a period of 27 years as a sub-editor of Dinamina and the editor of Dinamina, Silumina and Lakmina are not covered by this bibliography. Apart from these there were other feature articles and series of articles written by him where the authorship could not be conclusively established. All these articles have been excuded. This bibliography contains the articles he has written under his real name and under the pen names i.e. M. W. Vijitha Manuwarna, Mayurapada and Hetuwadi.

This bibliography consists of three main divisions - Sinhalese, English and other languages. The first and second divisions are again divided into sub sections, namely Chronological section, Title and Keyword Index and the Subject Index.

The chronological section consists of entries giving a full description of the documents ad are arranged in the chronological order. Entries in this section were made according to the (ISBD(M) and (ISBD (S) which were approved by the (IFLA) in 1975. However certain commissions and minor amendments have been done to suit the needs of this bibliography. For instance, the imprint area has not been included in the case of the well known periodicals and newspapers. Column numbers of newspapers articles are given next to the page numbers and

separated by a (:) colon. In the case of books, the colon has been used to separate the page description from illustrations. A diagonal slash has been used in the index to indicate were a little has been inverted. Annotations are given (in 8 point type) only where they are essential.

The Title and Keyword Index consists of titles of books, articles and chapter headings of books. Entries in respect of books were printed in bold type and the reference for chapter headings are given in parenthesis.

This bibliography was supplemented with a Subject Index to enable the user to get an idea of the subject field explored by Martin Wickramasinghe. The necessity of a subject index was strongly felt in this bibliography, since Martin Wickramasinghe's writings were spread through a range of subjects. Further the index supplements the title and keyword index, as some of the titles used by Martin Wickramasinghe in his articles are not self explanatory. In this subject index references are given to both English and Sinhalese articles.

Several libraries were used in the compilation of this bibliography. Apart from Martin Wickramasinghe's private library, National Archives, University libraries of Peradeniya, Vidyodaya and Colombo, Colombo Museum Library and Colombo Public Library were used. Libraries of The Times of Ceylon Ltd., Attha and Soviet Cultural House were also extensively used. If not for the co-operation extended to me by the authorities and officers of these libraries, this bibliography would not have been possible.

I wish to record my thanks to Mr. S. Govinnage who encouraged me to undertake this task. Dr. Ranga Wickramasinghe made a very valuable contribution to this project. To him I am indebted.

I was fortunate enough to be guided by two experts in the compilation process. They are Mr. Ian Goonetileke, the Librarian of the University of Sri Lanka, Peradeniya Campus and Mr. N. Amarasinghe, the Director of the Ceylon National Library Services Board. My Thanks are due to them.

My thanks are also due to M/ss Kusumsiri Perera, Shanthi Fernando. Jayalatha Weerasinghe, Rohini Jayawardhana, Girly Wimaladasa and Mr. P. A. Chandrakumara who helped me in the literature survey. Mr. G. D. Dayananda helped me in typing the manuscript.

Finally I wish to thank The Martin Wickramasinghe Trust for undertaking the publication of this bibliography and Tisara Publishers for a fine job printing, and for their patience.

Dhanapala Gunasekara
Sri Lanka National Library Services Board
74, Davidson Road,
Colombo 4.

## MARTIN WICKRAMASINGHE

The compilation of this bibliography involved an extensive search for all the available writings of Martin Wickramasinghe. It has made accessible much interesting information, the collection of which would normally be a prerequisite for any one who would undertake a study of Martin Wickramasinghe's writings and the social background in which he worked. The object of these introductory remarks is to draw attention to some aspects that deserve emphasis, to help users of this bibliography.

Martin Wickramasinghe's literary activities can be traced as far back as 1903 in which year his first publication, a poetry book titled "Balopadesaya" appeared. But he has not made any reference to this book in his later writings including his autobiography. Nor has he left any evidence of literary activities in earnest only in 1914. For the convenience of study his literary activities can be divided into 3 periods as follows :

1. Early period - (1914 - 1920). He worked as a free lance writer to Dinamina.
2. Middle period - (1920 - 1946). During this period he was attached to Lake House as a full time journalist.
3. Later period - (1946 - 1975). After retiring from Lake House he engaged in literary activities as a full time author.

However, this division does not imply that Martin Wickramasinghe devoted himself solely any one category of literary activity during any of these periods.

### Early Period (1914 - 1920)

In spite of the fact that he entered the literary scene as a novelist in 1914 he was better known among the Sinhala reading public as a journalist throughout this period. His first novel 'Leela' does not seem to have had ready sales. In his autobiography he mentions that not even 200 copies of Leela were sold during a period of two years. His second publication, a collection of essays titled Shastriya Lekhana appeared in 1919. Due to the lack of data it is not possible to ascertain how many copies of this book were sold. However, the fact that this book has not run into a second imprint and that he had not made any reference to this book in his later writings clearly reveal that this publication too did not have a very good response from the Sinhala reading public.

It is through Dinamina, the Sinhala daily newspaper, that he introduced himself to the wider reading public of this country. During the 6 years under consideration he contributed 14 articles in which the embryonic features of his later literary development can be discerned.

It is note worthy that Martin Wickramasinghe started his career at a time when the religious and cultural revivalism in Sri Lanka was gathering momentum and unifying into a national revivalist movement. The printing press that was introduced to our country in the 18 th century by the Dutch was a great asset to these movements in their propaganda activities. The activities of the Buddhist revivalists which paved the way for the national revivalist movement, were largely propagated through the Sinhala newspapers and periodicals.

As in India the nationalist movement in Sri Lanka emerged in the form of cultural revivalism. The preoccupation with language and literature was a dominant feature. A movement similar to that led by Mahatma Gandhi and Nehru in India was launched by the bilingual intelligentsia in our country. Sinhala newspapers and periodicals proved to be very effective in carrying this upsurge to the urban and rural folk.

These newspapers and periodicals also participated in controversies concerning several issues affecting cultural life of the people. It is interesting to note that there were instances where journals were started with the sole purpose of supporting a particular point of view in such controversies. 'Yatalaba Magazine' that was begun in 1845 by Pandit Batuwanthudawe is an example of such a journal. There is no doubt that these newspapers and periodicals had been widely read by the Sinhala reading public specially those who lived in villages. It was a very common occurrence for the Sinhala educated intelligentsia who lived in rural areas to voice their views through these publications, on topics that were the subject of current controversies. Religious controversies had an even wider influence and spread to the common village folk, even to the illiterate. Buddhist monks acting as intermediates used their sermons and discourses to arouse the interest of uneducated folk on issues that were the subject of contemporary debates and controversies. So it can be said that the newspapers and periodicals were instrumental in disseminating the social political dialogue among the rural masses, while acting as a stimulant in developing their reading habits.

However, the impact made by these media on the rural masses was of a restricted nature. One of the major shortcoming was these newspapers and journals concentrated on a very narrow subject field dictated by the needs of the revivalist movement, and these publications never attempted to educated the masses on a broader scale.

The majority of the leaders of the national revivalist movement belonged to the urban middle class. Among them were those of rural origin who had migrated to towns in search of employment and so had a knowledge of the Sinhala language. These urban dwellers had the opportunity to acquire English, and so of broader perspective of knowledge.

